# (උ) රජයේ මුදල් පරිහරණය

**1963 / 64 මුදල් වර්ෂය**

1963 ඔක්තෝබර් මාසයේ සිට 1964 සැප්තැම්බර් මාසය තෙක් වූ මුදල් වර්ෂය සඳහා ලංකාණ්ඩුවේ ගිණුම් සාරාංශය පසුගිය වර්ෂ වල අනුරූප සංඛ්‍යා තොරතුරු ද සමග II (උ) 1 සංඛ්‍යා සටහනේ දක්වේ. මේ සටහනෙහි දක්වා ඇති පරිදි අය-වැය ලේඛන ගනුදෙනුවල ප්‍රධාන ලක්‍ෂණ මෙසේය:-

(අ) 1963/64 රජයේ මුළු ආදායම රුපියල් කෝටි 175·35 ක් විය. 1962/63 දී මුළු ආදායම රුපියල් කෝටි 159·34 ක් වූ අතර, 1961/62 දී රුපියල් කෝටි 162·06 ක් විය.

(අ ) 1963/64 සම්මත මුළු වියදම (1) රුපියල් කෝටි 223·20 ක් විය. 1962/63 සම්මත මුළු වියදම රුපියල් කෝටි 199·87 ක් වූ අතර 1961/62 දී එය රුපියල් කෝටි 206·13 ක් විය. මේ සංඛ්‍යා වලට නිදහස් අරමුදල් දීමනා, ආදායමෙන් කෙලින්ම ගෙවන රාජ්‍ය ණය සහ පොත් ගැලපිලි ඇතුළත් නොවේ.

(ඇ) අත්තිකාරම් ගිණුම් ගනුදෙනු නිසා රුපියල් කෝටි 1·61 ක (ශුද්ධ) ලැබීමක් ඇති විය. 1962/63 මේ සම්බන්ධයෙන් රුපියල් කෝටි 1·37 ක (ශුද්ධ) ලැබීමක් ඇති වූ අතර, 1961/62 දී රුපියල් කෝටි 1·46 ක (ශුද්ධ) ගෙවීමක් ඇති විය.

(ඈ) මේ ගනුදෙනු (2) හේතු කොට ගෙන රජයට ඇති වූ (ශුද්ධ) අය-වැය හිඟය රුපියල් කෝටි 46·24 ක් විය. 1962/63 දී රුපියල් කෝටි 39·17 ක හිඟයක් ඇතිවූ අතර, 1961/62 දී ඇති වූ හිඟය රුපියල් කෝටි 45·61 ක් විය.

(ඉ) ශුද්ධ අය-වැය හිඟය වූ රුපියල් කෝටි 46·24 පියවා ගනු ලැබුයේ දේශීය වෙළෙඳ පොළෙන් රුපියල් කෝටි 32·13 ක් ණය ගැනීමෙන් හා විදේශ වලින් රුපියල් කෝටි 9·68 ක් ගැනීමෙනි. රුපියල් කෝටි 0·11 ක පරිපාලන ණය නැවත ගෙවීමකින් (ශුද්ධ) හා මුදල් ශේෂ රුපියල් කෝටි 4·54 කින් අඩුකිරීමෙන් එය සමහන් වී ගියේ ය.

(ඊ) එක්සත් ජනපද ප්‍රතිපාර්ශ්වීය, අරමුදල් වල ඇති වූ වෙනස් කම් වෙනුවෙන් ගැලපූ කල ශුද්ධ අය-වැය හිඟය නිසා ඇති වූ, ප්‍රාසාරණාත්මක බලපෑම 1963/64 දී රුපියල් කෝටි 16·29 ක් විය. මෙය 1962/63 දී රුපියල් කෝටි 16·20 ක් වූ අතර 1961/62 දී රුපියල් කෝටි 19·04 ක් විය.

**ආදායම.**

1963/64 මුදල් වර්ෂයේ රජයේ අය-වැය ලේඛන කටයුතු වල ඉතාමත් සතුටුදායක ලක්‍ෂණය වූයේ ආදායමෙහි ඇති වූ සැලකිය යුතු වැඩිවීමය. ප්‍රධාන අය ශීර්ෂ යටතේ රජයේ ඇස්තමේන්තු වල දක්වෙන පරිදි 1963/64 ඇස්තමේන්තු කළ ආදායම් සහ නියම වශයෙන් එකතු වූ ආදායම (තාවකාලික) II වැනි පරිශිෂ්ටයේ 18 වැනි සංඛ්‍යා සටහනේ දැක්වේ. මේ සංඛ්‍යා සටහනින් හෙළි වන පරිදි, 1963/64 රජයේ මුළු ආදායම රුපියල් කෝටි 175·35 ක් විය. 1962/63 නියම ආදායම වන රුපියල් කෝටි 159·34 ට වඩා මෙය රුපියල්, කෝටි 16·01 කින් වැඩි විය. මේ අනුව, 1961/62 වර්ෂයට වඩා 1962/63 දී ලැබුන ආදායම අඩු වුවද, 1963/64 එකතු වූ අය වැඩිවීමෙන් 1952/53 සිට පැවත එන වසරින් වසර අය වැඩිවීමේ හැඩ ගැස්මට නැවතත් එළඹියේ ය. 1962/63 එකතු වූ අය අඩුවීම 1963/64 රුපියල් කෝටි 16·01 කින් අය වැඩිවීමට හේතු වුවද, 1950/51 න් පසු වාර්ෂික ආදායම බොහෝ සෙයින් වැඩි වී ඇත්තේ 1963/64 වර්ෂයේ දීය.

---

1. II (උ)-1 සංඛ්‍යා සටහනේ ශීර්ෂ I ආ (I) සහ I ආ (II) යටතේ එකතුව
2. ජාතික සංවර්ධන සංචිතයට අය කැරෙන රුපියල් කෝටි 0·02 ක් ද වියදම් වශයෙන් ඇතුළත් වෙයි,

## සංඛ්‍යා සටහන II (ඪ) 1

රජයේ ශුද්ධ අය වැය

| | 1952/53 | 1953/54 | 1954/55 | 1955/56 |
|---|---|---|---|---|
| 1. ශුද්ධ අයවැය අතිරික්තය/හිගය (-) .. | – 231·9 | 33·7 | 127·6 | – 1·2 |
| අ. ආදයම .. .. .. | 952·5 | 1,026·2 | 1,158·6 | 1,257·2 |
| ආ. වියදම (එනම්, ණය ගැනීම් හෝ ණය ගනුදෙනුවල ශුද්ධ ලැබීම හෝ ගෙවීම අත්හැර මුළු ගෙවීම්) .. .. | –1,184·4 | – 992·5 | – 1,031·0 | –1,258·4 |
| (1) ආවර්තන වියදම (නිදන් අරමුදල් දයක දීමනා හා ආදයමෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් හැර) (2 ආ) (1) (අ) බලන්න ) .. .. | – 893·5 | – 772·0 | -864·9(ඇ) | –1,014·4 |
| (ආහාර ආධාර) .. .. .. | (127·0) | ( 12·0) | (36·0)(ඇ) | ( 79·5) |
| (1) ප්‍රාග්ධන වියදම් * .. .. .. | – 220·6 | – 162·3 | – 215·5 | – 211·0 |
| (3) ජාතික සංවර්ධන සංචිතයට අය වෙන වියදම් .. .. .. | – 6·4 | – 3·2 | – 2·1 | – 4·0 |
| (4) ගබඩා තොග හා උපකරණ ගිණුමට අත්තිකාරම් | – 2·4 | 4·6 | 9·9 | 1·2 |
| (5) අනෙකුත් අත්තිකාරම් * .. .. | – 52·8 | – 61·1 | 34·0 | – 30·3 |
| (6) විවිධ .. .. .. .. | – 8·7 | 1·5 | 7·6 | 0·1 |
| හිගය පියවීම | | | | |
| 2. රජ්‍ය ණය ගනුදෙනු වලින් උද්ගත වන ලැබීම් හා ගෙවීම් (ශුද්ධ) සහ විදේශීය දීමනා ලැබීම් .. .. .. | 216·5 | – 35·3 | – 39·0 | 12·2 |
| අ. පාලන ණය ගැනීම් හා ණය ගෙවීම් (විවිධකටයුතු සඳහා ගත් ණය ඇතුළුව) | 11·9 | – 4·6 | 29·1 | – 36·5 |
| (1) තැන්පතු (නඩු කියන්නන්ගෙන් හා කොන්ත්‍රාත් කරුවන් යනාදීන්ගෙන් හා 1959/60 ට වියදම් නොකොට ඉතිරිවී ඇති විදේශාධාර .. | 21·4 | – 2·1 | 34·5 | – 10·8 |
| (2) විවිධ අරමුදල් (වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල, රජයේ සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල ආදිය) .. .. | – 0·2 | 0·3 | – 0·9 | – 4·8 |
| (3) විවිධ ණය (කාෂිකාර්මික හා කාර්මික ණය දෙනු ආයතනය, ප්‍රාදේශීය ණය සංවර්ධන අරමුදල හා පලාත් පාලන මණ්ඩල ආදිය .. | – 9·3 | – 2·8 | – 4·5 | – 20·9 |
| ආ. දේශීය වෙළෙඳ ණය ගැනුම් හා ගත් ණය ආපසු ගෙවීම් .. .. | 204·6 | – 94·0 | – 80·2 | 43·5 |
| (1) රුපියල් ණය .. .. .. | 80·0 | 70·0 | 75·0 | 74·5 |
| නිදන් අරමුදල් දයක දීමනා හා ආදයමෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් අත්හැර .. .. .. | 23·1 | 22·6 | 44·5 | 39·0 |
| | 56·9 | 47·4 | 30·5 | 35·5 |
| (2) භාණ්ඩාගාර බිල් .. .. .. | 90·6 | – 78·1 | – 44·9 | 8·0 |
| (3) මහ බැංකුවේ අත්තිකාරම් .. .. | – 1·5 | – 4·7 | – 65·8 | — |
| (4) බදු සංචිත සහතික .. .. .. | — | — | — | — |
| (5) අනෙකුත් ** .. .. .. | 58·6 | – 58·6 | — | — |
| ඇ. විදේශීය ආධාර .. .. | — | 63·3 | 12·1 | 5·2 |
| (1) ණය ගෙවීම් .. .. .. | — | 63·3 | 12·1 | 5·2 |
| ආපසු ගෙවීම් අත්හැර .. .. | — | — | — | — |
| (2) දීමනා .. .. .. .. | — | 63·3 | 12·1 | 5·2 |
| | — | — | — | — |
| 3. මුදල් ශෙෂයන්ගේ වෙනස්වීම් (පහසුවෙන් මුදල් කළ හැකි වත්කම් ඇතුළුව) .. | – 15·4 | – 1·6 | 88·6 | 11·0 |

(අ) 1960/61 අයවැය ඇස්තමේන්තුවල ''ආදයමට අයවෙන වියදම්'' සහ ''ණය අරමුදල්වලට අය වෙන පෞද්ගලික වැටුප්, පරිපාලන වියදම්, දෙපාර්තමේන්තු විසින් සැපයෙන සේවා, ආර්ථික සංවර්ධනය යන වශයෙන් නැවත දෙවර්ගයකට බෙදන ලදී. මෙසේ රජයේ මුළු වියදම ශීර්ෂ හතරකට බෙද දක්වා ඇත. ශීර්ෂ 3, 5 හා 7 යටතේ ප්‍රාග්ධන සඳහා වූ මුළු වියදම් ද, වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් අයවෙන වියදම් හා ණය අරමුදල්වලට අයවෙන වියදම් වෙනම වෙනම ආවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් ගතවූ මුදල් වර්ෂ වලදී වැයවූ ණය කාර්යයන් සඳහා අත්තිකාරම් ගිණුම්හි පාඩු 'වර්තන වියදම්, ලංකාණ්ඩුවේ ගිණුම්වල සංඛ්‍යාවන් හා මෙහි සංඛ්‍යාවන් නොසැසඳේ.

(ආ) අර්ධ රාජ්‍ය නියෝජ්‍යත්වයන්ගෙන් ගත් ණය.

(ඇ) 1954/55 හේ ආහාර ආධාර සඳහා වූ රුපියල් කෝටි 3·6 ක මුදලක් අත්තිකාරම් ගිණුමේ සිට ඉවත්කර තිබුන ද, (* සංලක්ෂ්‍ය බලන්න) 1954/55 සංඛ්‍යාවන් එය ඇතුළත් කිරීමෙන්

(ඈ) 1959/60 දී ගෙවන ලද රුපියල් කෝටි 3·7 ක ජාත්‍යන්තර මුදල් මණ්ඩලයට වැඩි කළ දයක ලත් විශේෂ ණයකින් ජ. ස. ස. ට කළ ගෙවීම බේරීමට 1961/62 දී දුන් රුපියල් කෝටි 0·02 ක

(ඉ) 1960/61 සිට, විදේශ දීමනාවවලට අය වන ප්‍රාග්ධන වියදම් අය වැය ලේඛනයට ඇතුලත් කැරිණි 1960/61 ට පෙර විදේශ දීමනාවලින් වියදම් නොකොට ඉතිරිව භාණඩාගාරයේ මුදල්මාර්ගයක්ව

(ඊ) 1961/62 හා 1962/63 ආදයම් සංඛ්‍යා, රජයේ ගිණුම්වල පළ කැරුන සංඛ්‍යා වලට වඩා වෙනසි.
(i) 1961/62 දී, රජයේ ගිණුම් වල ජාතික සංවර්ධන අරමුදලට බැර කිරීමක් සේ සැලකුන රුපියල් ආදයමට පැවරුන රුපියල් කෝටි 2·06 ක් ඇතුළත් කොට නොතිබීමත්, විදේශීය රාජ හා ඇතුළත් නොකොට එය විදේශීය ආධාර (20–II ශීර්ෂය) යටතේ දක්වා තිබීමත්, (II) රාජ්‍යයන් හා නියෝජ්‍යත්වයන් මගින් දෙන ලද උපකරණ වල හා අනෙකුත් ආධාර වල වටිනා 1963/64 ජාතික සංවර්ධන බද්දෙන් ලත් රුපියල් කෝටි 0·29 ක් ආදයම් යටතේ ඇතුළත්කොට රුපියල් කෝටි 0·16 ක් ඇතුළත් නොකොට එය විදේශීය දීමනා යටතේ දක්වා තිබීමත්ය.

(උ) තාවකාලිකයි.

අතිරික්තය / හිඟය (—)

රුපියල් දශ ලක්ෂ

| 1956/57 | 1957/58 | 1958/59 | 1959/60 | 1960/61(ඉ) | 1961/62 | 1962/63 | 1963/64(උ) |
|---|---|---|---|---|---|---|---|
| – 196.4 | – 222.3 | – 413.4 | – 417.5 | – 462.5 | – 456.1 | – 391.7 | – 462.4 |
| 1,260.5 | 1,280.0 | 1,330.4 | 1,403.8 | 1,513.9 | 1,620.6 (ʃ) | 1,593.4(ඊ) | 1,753.5(ඊ) |
| –1,456.9 | –1,502.3 | –1,743.8 | –1,821.3 | –1,976.4 | –2,076.6 | –1,985.3 | –2,216.1 |
| –1,105.2 | –1,280.1 | –1,432.2 | -1,511.9(ඇ) | -1,540.8(ඇ) | -1,580.7(ඇ) | -1,596.4(ඇ) | -1,831.8(ඇ) |
| (105.5) | (112.0) | (146.5) | (193.0) | (248.0) | (235.4) | (225.8) | (375.4) |
| – 213.3 | – 282.6 | – 303.4 | – 306.6 | – 419.9 | – 480.6 | – 402.3 | – 400.2 |
| – 5.1 | – 3.0 | – 2.4 | – 1.5 | – 1.5 | – 0.7 | – 0.3 | – 0.2 |
| – 14.5 | — | 10.5 | – 7.1 | 1.9 | 2.4 | – 8.6 | – 5.2 |
| – 115.8 | 54.5 | – 17.1 | 5.8 | – 15.9 | – 15.8 | 27.9 | 15.1 |
| – 3.0 | 8.9 | 0.8 | — | – 0.2 | – 1.2 | – 5.6 | 6.2 |
| 175.4 | 174.7 | 351.8 | 411.6 | 462.5 | 496.3 | 391.3 | 417.0 |
| – 9.4 | 72.5 | 27.6 | 57.4 | 29.4 | 104.5 | – 33.8 | – 1.1 |
| 9.0 | 73.9 | 27.3 | 62.3 | 36.5 | 98.4 | – 28.0 | 1.0 |
| – 2.3 | 20.1 | 4.2 | 2.7 | – 1.0 | 4.8 | 0.1 | 2.5 |
| – 16.1 | – 21.5 | – 3.9 | – 7.6 | – 6.1 | 1.3 | – 5.9 | – 4.6 |
| 166.2 | 78.5 | 291.2 | 327.6 | 406.5 | 336.0 | 331.6 | 321.3 |
| 94.9 | 45.0 | 95.0 | 134.8 | 214.9 | 145.0 | 205.0 | 245.0 |
| 31.1 | 26.5 | 29.7 | 30.6 | 32.1 | 37.9 | 40.4 | 46.1 |
| 63.8 | 18.5 | 65.3 | 104.2 | 182.8 | 107.1 | 164.6 | 198.9 |
| – 3.0 | 74.6 | 179.0 | 228.2 | 198.4 | 248.0 | 124.1 | 128.4 |
| 96.3 | – 13.8 | 41.1 | 3.1(ඇ) | 20.6(ඇ) | 21.0(ඇ) | 36.6(ඇ) | – 19.4(ඇ) |
| 9.1 | – 0.8 | 5.8 | – 7.9 | 4.7 | 1.9 | 6.3 | 13.4 |
| — | — | — | — | — | — | — | — |
| 18.6 | 23.7 | 33.0 | 26.6 | 26.6 | 55.8 | 93.5 | 96.8 |
| 18.6 | 23.7 | 35.5 | 29.3 | 16.3 | 44.5 | 68.7 | 75.7 |
| — | — | 2.5 | 2.7 | 3.0 | 6.8 | 6.3 | 10.7 |
| 18.6 | 23.7 | 33.0 | 26.6 | 13.3 | 37.7 | 62.4 | 65.0 |
| — | — | — | — | 13.3 | 18.1 | 31.1 | 31.8 |
| –21.0 | – 47.5 | – 61.7 | – 6.0 | | 40.2 | – 0.4 | – 45.4 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුව

වියදම්'' යනුවෙන් වියදම් වර්ග කිරීමේ මෙතෙක් පැවති ක්‍රමය අත්හැර, ඒ වෙනුවට රජයේ මුළු වියදම්, විසින් කොටස් හතරකට බෙදන ලදී. පසුව දක්වන ලද එක් එක් වර්ගය වර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් මේ සටහනෙහි, වැය ශීර්ෂ 1, 2, 4 හා 6 යටතේ අක්වා ඇති පෞද්ගලික වැටුප් සහ වර්තන වියදම් ද, වැය කොට දක්වා ඇත. 1960/61 වර්ෂයට පෙර වර්ෂය සඳහා මෙවැනි වර්ග කිරීමෙක් නොමැති නිසා, ආදයමට වලට සමාන වෙතැයි සලකනු ලැබේ.
හා ප්‍රාග්ධන වියදමට මාරු කිරීමෙන් උද්ගතවන පොත් ගැලපිලි (හර සහ බැර) අත්හැර ඇත. එබැවින්

1958/59 දී ආදයමට අය වෙන වියදමට මාරු කරන ලදී. මේ පොත් ගැලපිල්ල 1958/59 සංඛ්‍යාවන්ගෙන් සංශොධනය කර ඇත.
දීමනාවද, 1960/61 ජා. ප්‍ර. ස. බැ. ට සහ ජා. ස. ස. ට කළ රුපියල් කෝටි 0·22 ක ගෙවීමද, මහ බැංකුවෙන් හා 1962/63 දී දුන් රුපියල් කෝටි 0·03 ක් ද අත්හැර ඇත.

පැවැති ශේෂ පමණක් පරිපාලන ණය ගිණුම් යටතේ ඇතුළත් කැරිණි.
ඊට හේතු වනුයේ:—
කෝටි 1·86 ක ජාතික සංවර්ධන බදු ආදයම් යටතේ දක්වා ඇති අතර ජාතික ගංවතුර සහනාධාර අරමුදලෙන් නියෝජ්‍යත්ව මගින් ප්‍රදනය කරන ලදුව ආදයමට බැර කැරුන උපකරණවල වටිනාකම වන රුපි. කෝටි0·47 ක් 1962/63 ජාතික සංවර්ධන බද්දෙන් ලත් රුපියල් කෝටි 1·75 ක් ආදයම් යටතේ ඇතුළත් කොට, විදේශීය කම වන රුපියල් කෝටි 0·28 ක් ඇතුළත් නොකොට එය විදේශීය දීමනා යටතේ දක්වා තිබීමත්ය (iii) විදේශීය රාජ්‍යයන් හා නියෝජ්‍යත්වයන් මගින් දෙන ලද උපකරණවල හා අනෙකුත් ආධාරවල වටිනාකම වන

සංඛ්‍යා සටහන II (උ) 2

ලංකාණ්ඩුවේ

රුපියල්

| | 1962/63 නියම | 1963/64 මුල් ඇස්ත මේන්තුව | 1963/64 සංශෝධිත ඇස්ත මේන්තුව | 1963/64 නියම (තාව කාලික) | 1964/65 මුල් ඇස්ත මේන්තුව |
|---|---|---|---|---|---|
| **1· පැවරුම් ආදායම්** .. | 1,278·8 | 1,430·7 | 1,348·7 | 1,397·8 | 1,437·8 |
| (අ) දේශීය අංශවල ආදයම් ගිණුම් වලින් හැරුණු අනිවාර්ය පැවරුම් .. | 306·9 | 297·3 | 273·3 | 320·0 | 250·4 |
| (i) පෞද්ගලික ආදායමෙන් බදු .. | 86·5 | ල. නො. | ල. නො. | 97·1 | ල. නො. |
| (ii) සංයුක්ත මණ්ඩල ආදායමෙන් බදු .. | 178·9 | ල. නො. | ල. නො. | 189·6 | ල. නො. |
| (iii) අනෙකුත් .. | 41·5 | ල. නො. | ල. නො. | 33·3 | ල. නො. |
| (ආ) නිෂ්පාදන හා වියදම් බදු .. | 938·6 | 1,087·9 | 1,044·6 | 1,051·2 | 1,139·1 |
| (i) සාමාන්‍ය අලවි හා පිරිවැටුම් බදු | 0·1 | 45·0 | 16·0 | 16·0 | 32·0 |
| (ii) විශේෂ අලෙවි බදු .. | 96·0 | 82·0 | 106·4 | 109·3 | 108·7 |
| (iii) ආනයන බදු .. | 397·7 | 487·3 | 464·2 | 481·5 | 520·1 |
| (iv) අපනයන බදු .. | 278·7 | 307·8 | 297·9 | 277·4 | 313·8 |
| (v) විදේශීය විනිමය බදු .. | — | 10·0 | 3·0 | 3·7 | 4·0 |
| (vi) බලපත්‍ර බදු .. | 17·8 | 17·3 | 20·3 | 22·3 | 20·3 |
| (vii) වත්කම් බදු .. | 36·3 | 40·0 | 41·8 | 38·7 | 42·7 |
| (viii) දේපල පැවරුම් බදු .. | 14·0 | 15·5 | 12·0 | 14·3 | 14·5 |
| (ix) රජයේ ඒකාධිකාරයන්හි අතිරික්තිය .. | 98·0 | 83·0 | 83·0 | 88·0 | 83·0 |
| (ඇ) ගේ දෙර අංශයේ ප්‍රාග්ධන ගිණුමෙන් පැවැරුම් .. | 33·3 | 30·5 | 26·8 | 23·9 | 41·3 |
| (i) බුදල් බදු .. | 8·3 | 8·5 | 7·5 | 8·4 | 9·0 |
| (ii) පෞද්ගලික බදු .. | 12·4 | 20·0 | 19·0 | 12·7 | 30·5 |
| (iii) ඉඩම් බදු .. | 11·2 | — | — | 2·7 | 1·5 |
| (iv) ප්‍රාග්ධන කොටස් බදු .. | 1·4 | 2·0 | 0·3 | 0·1 | 0·3 |
| (ඈ) දේශීය අංශවල ආදයම් ගිණුම් වලින් ස්වේඡාවර පැවරුම් .. | — | 15·0 | 4·0 | 2·7 | 7·0 |
| **2. භාණ්ඩ හා සේවා විකිනීම්** .. | 285·5 | 314·6 | 317·2 | 308·4 | 328·1 |
| (අ) දූනට ඇති ව්‍යාපාර වල භාණ්ඩ හා සේවා විකිනීම් .. | 285·5 | 314·6 | 317·2 | 308·4 | 328·1 |
| (ආ) දූනට පවත්නා ප්‍රාග්ධන භාණ්ඩ විකිනීම් .. | ... | ... | ... | — | ... |
| **3. දේපල ආදායම** .. | 8·4 | 19·3 | 23·2 | 20·1 | 33·4 |
| (අ) ලබාගත් පොළී හා ලාභ | 8·4 | 19·3 | 23·2 | 20·1 | 33·4 |
| **4. මූල්‍ය හිමිකම් පෑම්** .. | 20·7 | 23·1 | 22·0 | 27·1 | 22·1 |
| (අ) අවක්‍ර ණය හා අත්තිකාරම් ආපසු ගෙවීම් | 5·3 | 6·8 | 6·1 | 10·8 | 8·3 |
| (ආ) විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම් (ශුද්ධ) .. | 15·4 | 16·3 | 15·9 | 16·3 | 13·8 |
| එකතුව .. | 1,593·4† | 1,787·6 | 1,711·1 | 1,753·5† | 1,821·3 |

1. (අ) (i) පුද්ගලයන් (තොග වෙළෙඳුන් ඇතුළු) විසින්, ගෙවන ලද ආදයම් බදු වෙනුවෙන් වූ අඩි බදු, ජාතික සංවර්ධන බද්ද, අඩි බදු, සලාක පොත් බද්ද සහ වෘත්තිය ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ බදු වලින් සමන්විතය.

(ii) සමාගම් වලින් ගෙවන ලද ආදයම් බදු සහ ලාභාලාභ බදු වලින් සමන් විතය.

(iii) වීසා බලපත්‍ර බද්ද, දඩ මුදල් හා තහනම් කිරීම් සහ වෙනත් තැනක නොසඳහන් විවිධ ආදායම් වලින් සමන්විතය.

(ආ) (i) පිරිවැටුම් බද්දෙන් ලැබීම්

(ii) දුම්කොළ හා ගිනිපෙට්ටි දේශීය භාණ්ඩ බද්ද, දේශීය මත් ද්‍රව්‍ය බද්ද හා සූදු බද්දෙන් ලැබීම

(iii) බලපත්‍ර යටතේ පවත්නා ආනයන සඳහා වූ බලපත්‍ර ගාස්තු ඇතුළත්.

(iv) තේ බද්ද ඇතුලත්.

(v) විදේශීය විනිමය බද්ද

(vi) අරක්කු හා රා තැබෑරුම් බද්ද, මත් ද්‍රව්‍ය ගාස්තු යනාදියෙන් ලැබීම්

(vii) බැංකු හර බද්ද, කලුතෙල් රථ බද්ද, හා මෝටර් රථ බලපත්‍ර බද්ද යන මේවායින් ලැබීම්

(viii) මුද්දර ගාස්තු ආදයම

(ix) ගල්ඔය හා කන්තලේ බීම වර්ග ඇතුළු අරක්කු විකිණීමෙන් ලැබුනු ලාභ

(ඇ) ජාතික ලොතරැයිය සහ මුදලින් කළ තෑගි වලින් වූ ලැබීම් දක්වෙයි.

ආදායම

| දශ ලක්ෂ | | | සියයට ගණන | | |
|---|---|---|---|---|---|
| 1962/63 ට වඩා 1963/64 නියම ආදායම් (තාවකාලික වෙනස) | 1963/64 මුල් ඇස්තමේන්තු 1963/64 නියම ආදායමේ (තාවකාලික) වෙනස | 1963/64 මුල් ඇස්තමේන්තු වලට වඩා 1964/65 මුල් ඇස්තමේන්තු වල වෙනස | 1962/63 නියම | 1963/64 නියම (තාවකාලිකයි) | මුල් ඇස්තමේන්තු 1964/65 |
| 119·0 | — 32·9 | 7·1 | 80·3 | 79·7 | 78·9 |
| 13·1 | 22·7 | — 46·9 | 19·3 | 18·2 | 13·7 |
| 10·6 | ල. නො. | ල. නො. | 5·4 | 5·5 | ල. නො. |
| 10·7 | ල. නො | ල. නො. | 11·2 | 10·8 | ල. නො. |
| — 8·2 | ල. නො. | ල. නො. | 2·6 | 1·9 | ල. නො. |
| 112·6 | — 36·7 | 51·2 | 58·9 | 59·9 | 62·5 |
| 15·9 | — 29·0 | — 13·0 | ... | 0·9 | 1·8 |
| 13·3 | 27·3 | 26·7 | 6·0 | 6·2 | 6·0 |
| 83·8 | — 5·8 | 32·8 | 25·0 | 27·5 | 28·6 |
| — 1·3 | — 30·4 | 6·0 | 17·5 | 15·8 | 17·2 |
| 3·7 | — 6·3 | — 6·0 | — | 0·2 | 0·2 |
| 4·5 | 5·0 | 3·0 | 1·1 | 1·3 | 1·1 |
| 2·4 | — 1·3 | 2·7 | 2·3 | 2·2 | 2·3 |
| 0·3 | — 1·2 | — 1·0 | 0·9 | 0·8 | 0·8 |
| — 10·0 | 5·0 | — | 6·2 | 5·0 | 4·6 |
| — 9·4 | — 6·6 | 10·8 | 2·1 | 1·4 | 2·3 |
| 0·1 | — 0·1 | 0·5 | 0·5 | 0·5 | 0·5 |
| 0·3 | — 7·3 | 10·5 | 0·8 | 0·7 | 1·7 |
| — 8·5 | 2·7 | 1·5 | 0·7 | 0·2 | 0·1 |
| — 1·3 | — 1·9 | — 1·7 | 0·1 | ... | ... |
| 2·7 | — 12·3 | — 8·0 | — | 0·2 | 0·4 |
| 22·9 | — 6·2 | 13·5 | 17·9 | 17·6 | 18·0 |
| 22·9 | — 6·2 | 13·5 | 17·9 | 17·6 | 18·0 |
| .. | ... | ... | ... | ... | ... |
| 11·7 | 0·8 | 14·1 | 0·5 | 1·1 | 1·8 |
| 11·7 | 0·8 | 14·1 | 0·5 | 1·1 | 1·8 |
| 6·4 | 4·0 | — 1·0 | 1·3 | 1·5 | 1·2 |
| 5·5 | 4·0 | 1·5 | 0·3 | 0·6 | 0·5 |
| 0·9 | — | — 2·5 | 1·0 | 0·9 | 0·8 |
| 160·1 | — 34·1 * | 33·7 | 100·0 | 100·0 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංක මහ බැංකුවෙනි

2. (අ) පරිපාලනාත්මක සහ පරිපාලනාත්මක නොවන අය කිරීම්—දුම්රිය, විදුලි බලය, තැපැල්, සෞඛ්‍ය, හා ගුවන් විදුලි දෙපාර්තමේන්තු වලින් වූ දළ ලැබීම් සහ වරාය ගාස්තු, වැය මුදල් ආපසු ගෙවීම්, හා ඉඩකඩම් ආදායම් ඇතුලත් වේ.

3. (අ) පොළී, වාර්ෂික දීමනා ආදියෙන් ලැබීම්, වෙළඳ ව්‍යාපාර හා පොළී, පොළී වෙන් කොට දැක්විය නොහැකි මහ බැංකුවෙන් ලැබුණ ලාභ.

4. (අ) සමුපකාර තොග වෙළෙඳ ආයතනයෙහි දේශීය ණය, සංවර්ධන අරමුදල, ජාතික නිවාස අරමුදල ආදිය විසින් ඒකාබද්ධ අරමුදලින් ආපසු ගෙවුන අන්තිකාරම් සහ කොළඹ නගර සභා විසින් කැරුන වාර්ෂික දීමනාව

(ආ) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදලට දයක දීමනා

* එකතු වූ නියම් ආදායමට වඩා අදල අධි ඇස්තමේන්තුව 1962/63 මුදල් වර්ෂය සඳහා රුපියල් කෝටි 12.35ක් ද, 1961/62 සඳහා රුපියල් කෝටි 15.6ක් ද වේ. 1960/61 සඳහා ආදායමෙහි අධි ඇස්තමේන්තුව රුපියල් කෝටි 12.0ක් වේ.

† 1962/63 හා 1953/64 ආදායම් සංඛ්‍යා පහත දැක්වෙන ගැලපීම් නිසා රජයේ ගිණුම් වල පළ කැරුන සංඛ්‍යා වලට වඩා වෙනසි. ජාතික සංවර්ධන බදු වශයෙන් 1962/63 දී හා 1963/64 දී පිළිවෙලින් ලැබුණු රුපියල් කෝටි 1.75 සහ 0.29 ක් වූ ලැබීම් ආදායමට ඇතුලත් කර ඇති අතර, විදේශීය රාජ්‍යයන් හා නියෝජ්‍යත්වයන් විසින් 1962/63 හා 1963/64 දී පිරිනමන ලද පිළිවෙලින් රුපියල් කෝටි 0.28 ක් හා රුපියල් කෝටි 0.16 ක් වූ භාණ්ඩවල හා අනෙකුත් ආධාර වල වටිනාකම ඇතුලත් නොකර ඒවා විදේශීය දීමනා යටතේ දක්වා තිබේ.

II උ - 2 වැනි සංඛ්‍යා සටහනින් ආර්ථික ලක්‍ෂණ අනුව ආදායම නැවත වර්ග කොට ඇති අයුරු දැක්වේ. 1962/63 වර්ෂයට වඩා 1963/64 දී ආදායම වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ ආනයන බදු යටතේ ලැබුන ආදායම රුපියල් කෝටි 8·38 කින් වැඩිවීමය [I (ආ) (III) (ශීර්ෂය)]. මේ වර්ගය යටතේ ආදායම වැඩි වූ ශීර්ෂ වලට කපු පිළි "අනකුත් භාණ්ඩ"[1] සීනි ධාන්‍ය පිටි ආනයන වලින් ලැබුන බදු ඇතුළත් විය. අනෙකුත් වර්ග වලින් ලැබුන ආදායම් වලට ජංගම ගිණුම් කටයුතු වල භාණ්ඩ හා සේවා අලෙවියෙන් රුපියල් කෝටි 2·29 ක වැඩිවීමක්ද (ශීර්ෂ 2 අ) සාමන්‍ය අලෙවිය හා පිරිවැටුම් බදු වලින් [ශීර්ෂ 1 ආ (I)] රුපියල් කෝටි 1·59 ක් සහ පෞද්ගලික හා සාමායතන බදු වලින් [ශීර්ෂ I (අ) (I) සහ (II)] රුපියල් කෝටි 1·31 ක වැඩිවීමක් විය. එහෙත් රජයේ ඒකාධිකාරයන්ගේ සංචිත (ශීර්ෂ I ආ (IX)) සහ ඉඩම් බද්දෙන් ලැබුන [ශීර්ෂ I ආ (III)] රුපියල් කෝටි 1·0 කින් හා රුපියල් කෝටි 0·85 කින් පිළිවෙලින් අඩු විය.

### සංඛ්‍යා සටහන II (උ) - 3

### රජයේ ආදායම

රුපියල් දශලක්ෂ

| | 1963/64 මුල් ඇස්ත මේන්තු | 1963/64 නියම (තාවකාලිකයි) | 1962/63 නියම | 1962/63 වඩා 1963/64 වෙනස (නියම) | 1963/64 මුල් ඇස්ත මේන්තු හා සසඳන කල 63/64 (නියම) අධිකය(+) හෝ අඩුවීම(—) |
|---|---|---|---|---|---|
| 1. අපනයන බදු * | 307·8 | 277·4 | 278·7 | – 1·3 | — 30·4 |
| (අ) තේ (තේ බද්ද ඇතුලු) .. .. | 226·0 | 218·0 | 215·8 | 2·2 | — 8·0 |
| (ආ) රබර් .. .. .. .. | 40·0 | 11·8 | 29·3 | – 17·5 | — 28·2 |
| (ඇ) පොල් .. .. .. .. | 35·7 | 41·6 | 27·4 | 14·2 | + 5·9 |
| 2. ආනයන බදු (අ) * .. .. .. | 487·3 | 481·5 | 397·7 | 83·8 | — 5·8 |
| (අ) කපු පිළි .. .. .. | 20·0 | 47·5 | 22·8 | 24·7 | + 27·5 |
| (ආ) ධාන්‍ය හා පිටි .. .. .. | 18·3 | 29·3 | 13·1 | 16·2 | + 11·0 |
| (ඇ) භූමිතෙල්, මෝටර් තෙල්, සහ ද්‍රව ඉන්ධන .. .. .. | 110·0 | 88·3 | 100·3 | – 12·0 | — 21·7 |
| (ඈ) දුම්කොල හා සිගරට් .. .. | 45·0 | 39·8 | 46·1 | – 6·3 | — 5·2 |
| (ඉ) සීනි .. .. .. .. | 26·0 | 33·8 | 11·8 | 22·0 | + 7·8 |
| (ඊ) අනෙකුත් භාණ්ඩ * * .. .. | 217·5 | 180·9 | 148·3 | 32·6 | — 36·6 |
| 3. ආදයම් බදු (අධි බද්ද හැර) .. .. | 271·5 | 281·3 | 217·2 | 64·1 | + 9·8 |
| අධි බද්ද * * .. .. .. .. | — | 3·5 | 41·6 | – 38·1 | + 3·5 |
| 4. පෞද්ගලික බද්ද .. .. .. | 20·0 | 12·7 | 12·4 | 0·3 | — 7·3 |
| 5. අරක්කු විකිණීමෙන් ලාභ (ආ) .. .. | 83·0 | 88·0 | 98·0 | – 10·0 | + 5·0 |
| 6. දුම්කොල බද්ද .. .. .. | 66·0 | 92·3 | 80·3 | 12·0 | + 26·3 |
| 7. ඉඩම් බද්ද * * * .. .. .. | — | 2·7 | 11·2 | – 8·5 | + 2·7 |
| 8. ජාතික සංවර්ධන බද්ද * * * .. .. | 2·0 | 2·9 | 17·9 | – 15·0 | + 0·9 |
| 9. 1963/64 දී පනවන ලද අලුත් බදු හා ආදයම් විධිවිධාන | | | | | |
| (අ) පිරිවැටුම් බදු .. .. .. | 45·0 | 16·0 | — | 16·0 | — 29·0 |
| (ආ) විදේශීය විනිමය බද්ද .. .. | 10·0 | 3·7 | — | 3·7 | — 6·3 |
| (ඇ) ජාතික ලොතරැයිය .. .. | 15·0 | 2·7 | — | 2·7 | — 12·3 |
| 10. අනෙකුත් ආදයම් .. .. .. | 480·0 | 488·8 | 438·4 | 50·4 | + 8·8 |
| එකතුව .. .. .. | 1,787·6 | 1,753·5ඇ | 1,593·4ඇ | 160·1 | — 34·1 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1. රජයේ ආදයම් වර්ග කිරීමේදී දක්වන ලද ශීර්ෂයකි. (1වැනි ශීර්ෂයේ උපශීර්ෂ 1(9) )

(අ) බලපත්‍ර යටතේ තිබෙන ආනයන බලපත්‍ර ගාස්තු ඇතුළති.

(ආ) ගල්ඔය සහ කන්තලේ බීම ඇතුළති.

(ඇ) II ඌ 2 සංඛ්‍යා සටහනේ (+) අධෝ ලිපියෙහි දක්වා ඇති හේතුන් නිසා ආදයම් සංඛ්‍යා රජයේ ඇස්ත මේන්තු වල දක්වා තිබෙන සංඛ්‍යා වලට වඩා වෙනස් වෙයි.

* ශීර්ෂයනට ප්‍රධාන අයවීම් පමණක් ඇතුළත් වන බැවින් ප්‍රධාන ශීර්ෂයන් ගේ එකතුන් හා ඒවාට ඇතුළත් වන ශීර්ෂයන් ගේ එකතුන් හා එකටෙක ගැලපෙන්නේ නොවේ.

* * රජයේ ආදයම් විග්‍රහයේ දක්වා ඇති ශීර්ෂයකි. ( ශීර්ෂ 1 උපශීර්ෂ 1 (9) ).

* * * මෙම බදු දැනට බල පවත්නේ නොවේ.

1963/64 මුල් ඇස්තමේන්තු හා සසඳන විට ලැබුන නියම ආදායම රුපියල් කෝටි 3·41 කින් පමණ අඩු විය. මේ අඩුවීම එතරම් සැලකිය යුතු නොවන්නේ 1962/63 මුදල් වර්ෂය සඳහා ආදායම අධික ලෙස ඇස්තමේන්තු කර තිබීමත්, එකතු වූ නියම ආදායම රුපියල් කෝටි 12·35 ක් වීමත් නිසාය. 1961/62 දී ආදායම රුපියල් කෝටි 15·6 ක් වූ අතර, 1960/61 දී රුපියල් කෝටි 12·0 ක් විය. 1963/64 දී ආදායම රුපියල් කෝටි 3·41 කින් අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ අපනයන බදුවලින් (ශීර්ෂ I (ආ) (IV)) රුපියල් කෝටි 3·04 ක් පමණ සහ සාමාන්‍ය අලෙවි සහ පිරිවැටුම් බද්දෙන් [ශීර්ෂ I ආ (I)] රුපියල් කෝටි 2·90 ක් පමණ අඩුවීමය. අපනයන බදු ගණයේ ආදායම අඩුවී ගියේ රබර් (රුපියල් කෝටි 2·82) සහ තේ (රුපියල් කෝටි ·83) වලිනි. පිරිවැටුම් බද්ද ක්‍රියාත්මක කිරීම පමාවීම නිසා සාමාන්‍ය අලෙවි හා පිරිවැටුම් බද්ද යටතේ ලැබුන ආදායම අඩුවිය. අනෙක් අතට, තෝරා ගත් අලෙවි බදු [ශීර්ෂ I (අ) I සහ (II)] සහ පෞද්ගලික හා සමාගත ආදායම් වලින් අය කැරෙන බදු [ශීර්ෂ I (අ) (I) හා (II)] පිළිවෙළින් රුපියල් කෝටි 5·73 සහ රුපියල් කෝටි 2·27 ක වැඩිවීමක් දැක්විය.

II (උ)-3 සංඛ්‍යා සටහනින්, 1963/64 ප්‍රධාන ආදායම් ශීර්ෂ යටතේ ලැබුනු නියම ආදායම්වල (තාවකාලික) ඇතිවූ ප්‍රධාන වෙනස්කම් සවිස්තරව, ගෙනහැර පෙන්වා ඇති අතර, තවද එය 1962/63 නියම ආදායම හා 1963/64 මුල් ඇස්තමේන්තු සමග සසඳා ඇත.

1962/63 අපනයන බදුවලින් ලැබුන ආදායම හා සසඳන විට 1963/64 දී ඉන් ලැබුන ආදායම රුපියල් කෝටි 0·13 කින් අඩුය. මෙයට හේතු වූයේ තේ අපනයන බදු වලින් (කොළඹ හා ලංඩනයේ වෙන්දේසි වලදී අයකැරෙන තේ බද්ද ඇතුළුව) සහ පොල් නිෂ්පාදිත බදු වලින්ද ආදායම රුපියල් කෝටි ·22 කින් හා රුපියල් කෝටි 1·42 කින් වැඩි වුවද, රබර් අපනයන බදු වලින් ලද ආදායම රුපියල් කෝටි 1·75 අඩුවීමය. රබර් අපනයන බදු ආදායම අඩුවීම සඳහා පිටරට යැවූ රබර් ප්‍රමාණය අඩුවීමත් (රාත්තල් කෝටි ·07 කින්) රාත්තලක සාමාන්‍ය නැ.වි. ස. මිල (1) අඩුවීමත් (රාත්තලට සත 8 කින්) යන දෙකරුනම හේතු විය. අනෙක් අතට පොල් අපනයන වලින් ලද ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අපනයන පරිමාව වැඩිවීමත් සමගම, මිල ද වාසි සහගත වීමය. 1962/63 දී පිටරට යැවූ කොප්පරා ප්‍රමාණය ටොන් 43,100 ක් වූ අතර, 1963/64 දී එය ටොන් 59,300 ක් විය. 1962/63 දී පිටරට යැවූ කපාපු පොල් ප්‍රමාණය, ටොන් 47,200 ක් වූ අතර, 1963/64 දී එය ටොන් 55,100 දක්වා වැඩි විය. එසේම පොල් තෙල් ප්‍රමාණයද ටොන් 84,300 සිට 1, 04,500 දක්වා වැඩිවිය. තවද මිල සතුටුදායක වීම නිසා බදු ප්‍රමාණය වැඩිවීමෙන් අපනයන පරිමාව වැඩිවූ නිසා ඇතිවූ බලපෑම තවත් වැඩි විය. පොල් නිෂ්පාදිත තුනෙහිම සාමාන්‍ය මිල (නැ. වි. ස.) හොන්ඩරය රු. 56·94 සිට රු. 59·07 තෙක් වැඩි විය. 1962/63 දී තේ රාත්තලක නැ. වි. ස. මිල රු. 2·53 වුවද, 1963/64 දී සත 4 කින් අඩු වී 2·49 ට අඩු විය. එහෙත් තේ බද්දෙන් ලැබුන ආදායම තරමක් වැඩි විය. මෙයට හේතු වූයේ 1962/63 දී (2) වසරේ දීට වඩා 1963/64 දී අපනයන කළ තේ ප්‍රමාණය රාත්තල් කෝටි 2·13 කින් වැඩි වීමය;

---

(1) 1963.11.28 වැනි දින සිට රබර් සඳහා බදු වෙනස් වන මිල පදනම් කොට නියම කොට ඇත.

(2) 1963/64 අපනයන කළ තේ ප්‍රමාණය රාත්තල් කෝටි 47·29 වූ අතර 1962/63 දී අපනයන කළ ප්‍රමාණය ·29 රාත්තල් කෝටි 45·16 කි.

ඉහත සඳහන් කළ පරිදි, 1963/64 දී ආනයන බදුවලින් ලද ආදායම පසුගිය වසරට වඩා රුපියල් කෝටි 8·39 කින් හෙවත් සියයට 21·1 කින් වැඩිවී ඇති බවත් සටහන් වී ඇත. කපු පිළි (රුපියල් කෝටි 2·47) සීනි (රුපියල් කෝටි 2·20) ධාන්‍ය සහ පිටි (රුපියල් කෝටි 1·62) 'අනෙකුත් භාණ්ඩ'' (රුපියල් කෝටි 3·26) යන ශිර්ෂ යටතේ ඇතිවූ වැඩිවීම රුපියල් කෝටි 9·55 ක් වෙයි. එහෙත්, භූමිතෙල්, මෝටර් ස්ප්‍රිත්තු ද්‍රව ඉන්ධන (රුපියල් කෝටි 1·20) දුම්කොළ සහ සිගරට් (රුපියල් කෝටි 0·63) වලින් ලැබුන බදු ආදායම අඩුවීම නිසා මේ වැඩිවීම තරමක් දුරට මැකී ගියේය. කපු පිළි, සීනි, ධාන්‍ය සහ පිටි යටතේ ලැබුන බදු ආදායම වැඩිවූයේ ධාන්‍ය සහ පිටි යටතේ ආහාර කොමසාරිස්වරයාගෙන් ලැබීමට තිබුන හිඟ බදු මුදල් ලබා ගැනීම නිසාය. සමාලෝචනයට භාජනය වී ඇති අවුරුද්දේ දී ගෙන්වන ලද රෙදිපිළි ප්‍රමාණය දෙගුණයක් වී ඇති බව, ආනයන දර්ශකයෙන් හෙළි වෙයි. එසේම භූමිතෙල් සහ මෝටර් ස්ප්‍රිත්තු ආදියෙන් ලැබුන ආදායම අඩුවීමට හේතුවී ඇත්තේ ඛණිජ තෙල් සංස්ථාවෙන් ලැබිය යුතු බදු පමාවීම නිසාය. සිගරැට් හා දුම්කොළ ආනයන බදු, ආදායම අඩුවූයේ ගෙන්වන ලද පරිමාව අඩුවීම නිසාය. "අනෙකුත් භාණ්ඩ'' වර්ග යටතේ බදු ආදායම වැඩි වූයේ සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී භාණ්ඩ සීමාකිරීම සඳහා ගත් පියවරවලට අතිරේක වශයෙන් 1963 දී ආනයන බද්ද, අධික ලෙස වැඩි කිරීම හේතු කොට ගෙනය.

1963/64 ආදායම් බදු වලින් ලැබුන ප්‍රමාණය (අධි බද්ද හැර) 1962/63 නියම වශයෙන් ලැබුන ප්‍රමාණය හා සසඳන විට, රුපියල් කෝටි 6·41 කින් හෙවත් සියයට 29·5 කින් වැඩි විය. ආදායම් බද්දෙන් ලැබුන ආදායම වැඩිවීමට හේතු පහත දැක්වේ.

(අ ) සමාගම් වලින් අය කරන බද්ද සියයට 45 සිට 75 දක්වා වැඩි කිරීම

(ආ) පුද්ගලයන් කෙරෙහි පැනවෙන අවම බදු අනුපාතිකයන් සියයට 5 සිට 15 දක්වා වැඩි කිරීම

(ඇ) භාර්යාවට සහ ළමයිනට දෙන බදු මුක්ත දීමනාව අඩුකිරීම සහ යැපෙන ඥාතීන්ට දෙන දීමනාව සීමා කිරීම

(ඈ) බදු ශ්‍රෙණී වෙනස් කිරීම

(ඉ ) විමර්ශනාංශයෙන් කරන ලද විශෙෂ වැඩ

(ඊ) වඩාත් සඵල ලෙස බදු පරිපාලනය කිරීම

පසුගිය වර්ෂය හා සසඳන විට ආදායම් බදු සහ ජාතික සංවර්ධන බදු අධිභාරය රුපියල් කෝටි 3·81 කින් හා රුපියල් කෝටි 1·50 කින් අඩුවිය. මේ බදු වර්ග දෙකෙන් තුබුන ආදායම අඩුවීමට හේතු වූයේ මේ බදු 1963/64 දී බල නොපැවැත්වීමය. ඒ වර්ෂයේ මේ සම්බන්ධයෙන් ලැබුන ආදායම ප්‍රධාන වශයෙන්ම නොගෙවා ඇති බදු මුදල් ලැබීම නිසා විය.

1963/64 දී පනවන ලද අළුත් බදු හා ආදායම් මාර්ගවලින් රුපියල් කෝටි 4·76 ක අඩුවීමක් දැක්වේ. පිරිවැටුම් බද්දෙන් රුපියල් කෝටි 4·50 ක් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ද එය රුපියල් කෝටි 2·90 කින් අඩු විය. විදේශිය විනිමය බද්දෙන් රුපියල් කෝටි 1·00 ක් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ද, ලැබුන ආදායම රුපියල් කෝටි 0·63 කින් අඩු විය. පිරිවැටුම් බදු වලින් ලද ආදායම අඩුවීමට හේතු වූයේ නිෂ්පාදිත පිරිවැටුම් බදු

අනුපාතිකය [1] අඩුවනායුරු සංශොධනය කිරීමත්, එම මුදල් වර්ෂයට කාර්තු දෙකක [2] අය පමණක් එකතුවීමත් නිසාය. විදේශීය විනිමය බද්ද ක්‍රියාත්මක වන දිනය 1964 ජනවාරි 11 වැනි දිනට නියමවූ බැවින් මේ බද්දෙන් ලැබුන ආදායම අඩු වූයේද, 1963/64 වසරට එකතු වූයේ කාර්තු දෙකක අය පමණක් නිසාය. ජාතික ලොතරැයියෙන් රුපියල් කෝටි 1·5 ක් ලබා ගැනීමට ඇස්තුමේන්තු කල ද ලැබුන ආදායම රුපියල් කෝටි 0·27 ක් පමණකි. ජාතික ලොතරැයිය සමග කර්මාන්ත ප්‍රදර්ශන ලොතරැයියක්ද පවත්වාගෙන යාම නිසා මේ මාර්ගයෙන් ලැබුන ආදායම තරමක් දුරට අඩු වූවා විය හැකිය.

පසුගිය වසරට වඩා වෙනස්කම් ඇති වූ අනෙක් අය මාර්ග දෙක වූයේ දුම්කොළ බද්ද සහ අරක්කු විකිණීමෙන් ලැබුන ලාභයයි. දුම්කොළ බද්දෙන් රුපියල් කෝටි 1·20 ක් වැඩිපුර ලැබීමට හේතු වූයේ මෙරට දුම්කොළ පාවිච්චිය වැඩිවීමත් බදු අනුපාතිකය වැඩිවීමත්ය. මෙරට දුම්කොළ පාවිච්චිය පසුගිය වසරට වඩා රාත්තල් 41,8,332 කින් වැඩිවිය. බදු අනුපාතිකය ද 1963-7-31 වැනි දින සිට රාත්තලට රු. 28·00 සිට රු. 28·50 දක්වා වැඩි කරන ලදී. අරක්කු විකිනීමෙන් ලද ලාභය රුපියල් කෝටි 8·8 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 1·0 කින් අඩුය. මෙයට හේතු වූයේ පසුගිය අවුරුදු වල එකතු වූ ලාභ වලින් රුපියල් කෝටි 1·8 ක් 1962/63 ආදායමට බැර කිරීමයි. 1963/64 මුල් ඇස්තමේන්තු හා සසඳන විට ලැබුන ආදායම රුපියල් කෝටි 0·5 කින් වැඩි වී ඇත. වෙනසට හේතු වූයේ පසුගිය අවුරුදු වල ලාභ වලින් අමතර රුපියල් කෝටි 0·5 බැර කිරීමට ගනු ලැබූ තීරණයයි.

වියදම.

රජයේ වියදම්, වාර්ෂිකව ගෙන දෙවැනි පරිශිෂ්ටයේ 17 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. දෙවැනි පරිශිෂ්ටයේ 19 වැනි සංඛ්‍යා සටහනින් 1963/64 ප්‍රාග්ධන වියදම්* සහ වර්තන වියදම් වල මූල්‍ය ඇස්තමේන්තු සහ පරිපූරක වෙන් කිරීම දක්වා ඇත. එසේම 1963/64 නියම, වියදම් හා 1964/65 මුල් ඇස්තමේන්තු ද, එහි දක්වා ඇත. මුළු වියදම රුපියල් කෝටි 221·61 ක් වෙයි. මෙය, පසුගිය මුදල් වර්ෂයට වඩා රුපියල් කෝටි 23·08 කින් හෙවත් සියයට 11·6 කින් වැඩිය. එසේම, රජයේ මුළු වියදම පසුගිය දශකය තුළ එනම් 1954/55 සිට 1963/64 තෙක්, වසරකට සාමාන්‍යයෙන් රුපියල් කෝටි 11·85 ගණනේ වැඩිකර ඇති බව පෙනේ.

1963/64 වර්තන වියදම ** රුපියල් කෝටි 183·18 ක් විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 23·54 කින් වැඩිය. එහෙත් ප්‍රාග්ධන වියදම*** මදක් රුපියල් කෝටි 0·21 කින් අඩුවී ඇත. 1962/63 දී රුපියල් කෝටි 40·23 ක් වූ මෙය 1963/64 දී රුපියල් කෝටි 40·02 කට අඩු විය. අමාත්‍යාංශ වලින් සිදු කොට ඇති විග්‍රහ අනුව. වර්තන වියදම බොහෝ සෙයින් වැඩිවී තිබෙන්නේ

1 අය–වැය කථාවේ කම්වූ අවස්ථාවේ දී, නිෂ්පාදකයනගේ පිරිවැටුම් බදු අනුපාතිකය සියයට 1–10 සිට සියයට 3 දක්වා අඩු කළේය.

2 පිරිවැටුම් බද්ද, 1964 ජනවාරි පළමු වැනි ද සිටක්‍රියාත්මක විය. මේ බදු යටතේ මුදල් අය කිරීම කාර්තු පදනම් කොට කරන නිසා 1963/64 අවසාන කාර්තුවේ අය 1964/65 මුදල් වර්ෂයට එකතු විය හැකිය

* ඇස්තමේන්තුවල වර්ගකොට ඇති අයුරු.

** නිදහස් අරමුදල් වලට වූ දායක දීමනා හා රාජ්‍ය ණය අවික්‍රා ආපසු ගෙවීම් සහ පොත් ගැලපිලි හැර ඇස්තමේන්තුවල දක්වෙන වැය ශීර්ෂ 12, 4 සහ 6 යේ එකතුව

*** ඇස්තමේන්තුවල දක්වෙන වැය ශීර්ෂ 3, 5 සහ 7 හි එකතුව.

කෘෂිකර්ම, ආහාර සහ ධීවර අමාත්‍යාංශය යටතේය. තැපැල් හා විදුලි සේවා අමාත්‍යාංශය, මුදල්, පලාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයද 1963/64 දී සිය වර්තන වියදම් වැඩිකොට තිබේ. එහෙත් සමාජ සේවා සහ සංස්කෘතික අමාත්‍යාංශය, ගමනා ගමන යන අමාත්‍යාංශවල වර්තන වියදම් 1963/64 දී අඩුවී ඇත. ප්‍රාග්ධන වියදම් වැඩි වශයෙන්ම වැයකොට ඇත්තේ, බාහිර හා අභ්‍යන්තර වෙළෙඳුම හා සැපැයුම්, ග්‍රාම හා කාර්මික සංවර්ධන සහ මුදල් යන අමාත්‍යාංශවලිනි. එහෙත්, සංස්කෘතික කටයුතු හා සමාජසේවා, ඉඩම් වාරිමාර්ග හා විදුලිය, පලාත්පාලන හා ස්වදේශ කටයුතු යන අමාත්‍යාංශවල ප්‍රාග්ධන වියදම් පසුගිය මුදල් වර්ෂයට වඩා අඩුකරන ලදී.

1963/64 දී වර්තන හා ප්‍රාග්ධන වැය සම්මත යටතේ, කරන ලද නියම වියදම මුල් ඇස්තමේන්තුවට වඩා වෙනස්ය. වර්තන වියදම් රුපියල් කෝටි 9·78 කින් වැඩිවූ අතර, ප්‍රාග්ධන සම්මත යටතේ වියදම්, රුපියල් කෝටි 11·61 කින් අඩු විය. වැඩිදුර විග්‍රහ කිරීමේදී, වර්තන වියදම් යටතේ වියදම් වැඩිවී ඇත්තේ, කෘෂිකර්ම, ආහාර සහ ධීවර සහ අධ්‍යාපන අමාත්‍යාංශ යටතේ බව හෙළිවෙයි. එසේම, ප්‍රාග්ධන වියදම අඩුවීමට හේතුවී ඇත්තේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිය අභ්‍යන්තර, හා බාහිර, වෙළෙඳුම හා සැපයීම යන අමාත්‍යාංශවල ප්‍රාග්ධන ඌනව වැය කිරීම හේතුකොට ගෙනය.

1963/64 නියම වියදමෙහි (තාවකාලික) වූ ප්‍රධාන වෙනස්කම් 1962/63 නියම වියදම් සමගද, 1964/65 මුල් ඇස්තමේන්තු වර්තන හා ප්‍රාග්ධන වියදම් යන හිසින් නැවත වගීකොට, ඒ සමගද සසඳ පහත දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (උ) – 4

රජයේ වියදම.

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | වර්තන වියදම (1) | ප්‍රාග්ධන වියදම් (2) | | | මුළු වියදම් |
|---|---|---|---|---|---|
| | | මූර්ත වත්කම් අත්කර ගැනීම, නිර්මාණය කිරීම හා පවත්වා ගෙන යාම | මූල්‍ය වත්කම් අයත් කර ගැනීම (රාජ්‍ය නියෝජ්‍යත්වයනට දුන් ණය ඇතුලත්ය | මුළු ප්‍රාග්ධන වියදම් | |
| 1960/61 .. .. .. | 1,471·3 | 471·9 | 47·2 | 519·1 | 1,990·4 |
| 1961/62 .. .. .. | 1,498·1 | 499·4 | 86·2 | 585·6 | 2,083·7 |
| 1962/63 .. .. .. | 1,534·0 | 479·1 | 9·9 | 489·0 | 2,023·0 |
| 1963/64 මුල් ඇස්තමේන්තු .. | 1,660·7 | 608·8 | 30·6 | 639·4 | 2,300·1 |
| නියම (තාවකාලික) .. | 1,758·4 | 466·8 | 36·5 | 503·3 | 2,261·7 |
| 1964/65 මුල් ඇස්තමේන්තු .. | 1,745·1 | 626·6 | 21·0 | 647·6 | 2,392·7 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1. වර්තන වියදම ලබා ගන්නේ නිදන් අරමුදල් දීමනා න හා ආදයමින් හා ප්‍රාග්ධන ස්වරූපිය වියදම්වලින් රාජ්‍යණය අවක්‍රම ආපසු ගෙවීම් (නඩත්තු වියදම් සහ කල් පවත්නා භාණ්ඩ මිලට ගැනීම) පුනාවර්තන වියදම් වලින් (1, 2, 4 සහ 6 වැනිශීර්ෂ) අඩු කිරීමෙනි.

2. ප්‍රාග්ධන වියදම් ලෙස සැලකෙන්නේ, අවුරුද්දකට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට ගතහැකි වත්කම්, නිර්මාණය ලබා ගැනීම හා නඩත්තුව සඳහා යන වියදම් සහ මූල්‍ය වත්කම් අත්කර ගැනීමේ වියදම් ය. මෙයට ප්‍රධාන වශයෙන් ලං. ග. ම. යට වරාය සංයුක්ත මණ්ඩලයට දේශීය ණය වලට හා සංවර්ධන අරමුදලට දෙන ණය ගැනේ. ප්‍රාග්ධන වියදම්වලට සංවර්ධනයට නො ගැනෙන සමහර වියදම් ඇතුළත් වන නිසාත්, සංවර්ධනයට ගැනෙන සමහර වර්තන වියදම් ඇතුළත් නොවන නිසාත් ප්‍රාග්ධන වියදම් සංවර්ධන වියදම් හා සැසැඳෙන්නේ නොවේ. ප්‍රාග්ධන වියදම් වලට ප්‍රාග්ධන වැය ශීර්ෂ (3, 5 සහ 7) යටතේ ගැනෙන වියදම් ද, විදේශීය ආධාර, ණය සහ දීමනා වලින් වන වියදම් ද, වර්තන වියදම්වලට ප්‍රාග්ධන ශීර්ෂ තේ හා රබර් නැවත වගා කිරීමේ ආධාර, 1960/61 කෝටි 2·83, 1961/62 කෝටි 2·18, 1962/63 කෝටි 2·39, 1963/64 කෝටි 4·91 (ඇස්තමේන්තු) හා රුපියල් කෝටි 2·95 (තාවකාලික) සහ 1964/65 රුපියල් කෝටි 2·35 ක්ද විය.

**වර්තන වියදම්.**

1963/64 නියම වර්තන වියදම් පිළිබඳ, තාවකාලික සංඛ්‍යා අනුව, එම අවුරුද්දේ ඇස්තමේන්තුවලට වඩා රු. කෝටි 9·77 ක වැඩිවීමක් දක්වයි. 1963/64 (තාවකාලික) වියදම 1962/63 සංඛ්‍යාවට වඩා රුපියල් කෝටි 22·44 කින් වැඩි විය. 1962/63 දී එය 1961/62 දී දීට වඩා රුපියල් කෝටි 3·59 කින් වැඩිවිය. 1960/61 දී සහ 1961/62 දී වර්තන වියදම් පිළිවෙලින් රු. කෝටි 10·59 කින් හා රු. කෝටි 2·68 කින් වැඩිවිය. 1963/64 දී වර්තන වියදම වැඩිවීමට තුඩු දුන් ප්‍රධාන කරුණු අතර, ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීමට සිදුවූ වැඩිවී ගිය ආහාර ආධාරය රාජ්‍යණය සඳහා වැඩිවූ පොළී වියදම, අධ්‍යාපනය විශ්‍රාම වැටුප් හා සෞඛ්‍ය, යන වියදම් ඇතුලත් විය. (II උ-5 සංඛ්‍යා සටහන බලන්න.) මෙකී වියදම් වැඩිවීම නිසා, වර්තන වියදම පසුගිය වසරට වඩා වැඩිවිය.

සංඛ්‍යා සටහන II (උ) – 5

**ප්‍රධාන වර්තන වියදම් ශීර්ෂ.**

රුපියල් දශලක්ෂ

| | 1962/63 නියම | 1963/64 නියම තාවකාලික | 1963/64 මුල් ඇස්තමේන්තු | 1964/65 මුල් ඇස්තමේන්තු |
|---|---|---|---|---|
| 1. ආහාර ආධාරය | 225·8‡ | 375·4‡ | 272·9 | 327·0 |
| 2. රාජ්‍ය ණය පොළී | 98·1 | 113·1 | 111·0 | 100·4 |
| 3. විශ්‍රාම වැටුප් | 115·4 | 130·0 | 126·9 | 135·8 |
| 4. අධ්‍යාපනය * | 291·6 | 315·0 | 303·0 | 315·9 |
| 5. සෞඛ්‍යය | 144·8 | 149·3 | 151·6 | 152·5 |
| 6. එකතුව (ශීර්ෂ 1–5) | 875·7 | 1,082·8 | 965·4 | 1,031·6 |
| 7. මුළු වර්තන වියදම | 1,534·0 | 1,758·4 | 1,660·7 | 1,745·1 |
| 8. 6, 7 සියයට ගණන වශයෙන් | 57·1 | 61·6 | 58·1 | 59·1 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ වියදම් ඇතුළත් වෙයි.
‡ මෙ සංඛ්‍යා භාණ්ඩාගාර ලෙජරයන්හි දි ඇත.

1963/64 ආහාර සහනාධාරය (ශුඩ) රුපියල් කෝටි 37·54 ක් විය. 1962/63 දී එය රුපියල් කෝටි 22·58 ක් විය (1). පසුගිය මුදල් වර්ෂවල ආහාර සහනාධාර සංඛ්‍යා මෙසේය:– 1961/62 රුපියල් කෝටි 23·54. 1960/61 රුපියල් කෝටි 24·80. 1959/60 රුපියල් කෝටි 19·30. ආහාර සහනාධාර මුළු වර්තන වියදම් වල සියයට ගණනක් වශයෙන් සලකන විට, 1963/64 දී එය සියයට 21·3 ක් විය. 1962/63 දී සියයට 14·8 ක් විය. 1961/62 දී සියයට 15·7 ක් වූ අතර 1960/61 දී සියයට 16·9 ක් විය. 1963/64 දී රුපියල් කෝටි 37·74 ක් වූ ආහාර සහනාධාරය (ශුඩ) ගොවිජන සේවා කොමසාරිස් විසින් දෙන ලද ප්‍රතිදානය වන රුපියල් කෝටි 0·20 හැර වැඩිවූ සහනාධාර හා ගැලපූ විට සියයට 21·5 ක් වේ.

(1) මෙ සංඛ්‍යා භාණ්ඩාගාර ලෙජරවල දී ඇති පරිදිය.

1963/64 මුදල් වර්ෂය සඳහා ආහාර කොමසාරිස්වරයා විසින් සපයා ඇති තාවකාලික සංඛ්‍යා තොරතුරු පදනම් කොට, ආහාර ආධාරය වශී කොට සහ ගොවිජන සේවා කොමසාරිස් විසින් දෙන ලද ප්‍රතිදානය 1962/63 නියම(1) සංඛ්‍යා සමග ගලපා II උ-6 සංඛ්‍යා සටහනේ දී ඇත. වසර දෙක අතරේ වෙනස් කම් ද දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II (උ) - 6

### 1963/64 ආහාර ආධාර වියදම 1962/63 වියදම් හා සසඳ

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 | 1963/64* | වෙනස | |
|---|---|---|---|---|
| 1. ආනයන සහල් විකිණීමෙන් පාඩුව (ආධාරය) (1) .. | 125·3 | 128·5 | — 3·2 | පාඩුව වැඩි විය. |
| 2. මෙරට සහල් විකිණීමෙන් පාඩුව (ආධාරය) (1) .. | 283·2 | 295·6 | — 12·4 | පාඩුව වැඩි විය. |
| 3. මෙරට රතුළුනු ආධාරය .. | 2·6 | 2·5 | + 0·1 | අඩුවූ පාඩුව. |
| 4. බෙදහැරීම් වියදම් හා අනෙකුත් ගෙවීම් .. .. .. | 26·3 | 36·6 | — 10·3 | පාඩුව වැඩි විය. |
| 5. එකතුව (1 සිට 4) .. .. | 437·4 | 463·3 | | |
| 6. සීනි විකිණීමෙන් ලාභ .. | 154·6 | 75·1 | — 79·5 | ලාභ අඩු විය. |
| 7. පිටි විකිණීමෙන් ලාභ .. | 27·0 | 1·0 | — 26·0 | ලාභ අඩු විය. |
| 8. අනෙකුත් භාණ්ඩ .. .. | 17·0 | 9·8 | — 8·1 | ලාභ අඩු විය. |
| 9. එකතුව (6 සිට 8) .. .. | 199·5 | 85·9 | | |
| 10. මුළු ආධාරය (ශුද්ධ) .. | 238·0 (2) | 377·4 (2) | — 139·4 | පාඩුව වැඩි විය |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* තාවකාලිකයි.

(1) සහල් ආධාරය නිසා වන පාඩුව, (ඒකකයකට) ගණනය කරන්නේ මෙසේය.

(1) ආනයන කරන සහල් විකිණීමෙන් වන පාඩුව (ආධාරය) වශයෙන් සැලකෙන්නේ එම සහල් ගොඩ බාන විට රජයට වන මිල සාමාන්‍යයෙන් බලයලත් (සිල්ලර) බෙද හරින්නාට විකුණන මිල සාමන්‍යයන් අතර ඇති වෙනසය. ගොඩබාන මිලට, මිලත්, ගැල්කුලියත්, ගබඩාවට යවන තෙක් වන අනෙකුත් වියදමුත් ඇතුළත් වෙයි.

(ii) මෙරට සහල් විකිණීමෙන් වන පාඩුව (ආධාරය) වශයෙන් සැලකෙන්නේ, මෙරට සහල් ගැනීමේදී රජයට වන මිලත්, එම සහල් බලය ලත් (සිල්ලර) බෙදහරින්නාට, විකිණීමේදී වන මිලත් අතර ඇති වෙනසය.

ආනයන සහල් වලින් වන පාඩුව පාරිභෝගිකයාට දෙනු ලබන ආධාරයක් වන අතර, මෙරට සහල් වලින් ඇතිවන පාඩුව, පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට යන දෙදෙනාටම දෙන ආධාරයකි.

| **1962/63** | රු. දශ ලක්ෂ |
|---|---|
| 1. භාණ්ඩාගාර සංඛ්‍යා | 225·8 |
| 2. අන්තිකාරම් ගිණුමෙන් යෙදවූ ප්‍රමාණය | 12·7 |
| ආහාර කොමසාරිස්ගේ තාවකාලික ඇස්තමේන්තුව | 238·5 |
| අඩු කරන ප්‍රමාණය | 13·2 |
| 3. ආහාර කොමසාරිස් විසින් දක්වා ඇති නියම සංඛ්‍යාව (තාවකාලික) 1961/62 සඳහා ගොවිජනසේවා කොමසාරිස් විසින් දෙනලද රුපියල් කෝටි 1·47 ප්‍රතිදානයක්ද ඇතුළුව | 225·3 |
| 4, ඉහත .3 දැක්වූ ප්‍රතිදානය හැර | 14·7 |
| | 240·0 |
| 5. ගොවිජනසේවා කොමසාරිස් විසින්, 1962/63 වෙනුවෙන් දුන් 1963/64 යටතේ පෙන්වා ඇති ප්‍රතිදානය ඇතුළුව | 2·0 |
| 6. මුළු සහනාධාරය | 238·0 |

| **1963/64** | රුපියල් දශ ලක්ෂ |
|---|---|
| 1. භාණ්ඩාගාරයේ සහ ආහාර කොමසාරිස්ගේ (තාවකාලික) සංඛ්‍යා. 1962/63 වර්ෂය සඳහා රුපියල් කෝටි ·20 ක ප්‍රතිදානයක්ද ඇතුළුව | 375·4 |
| 2. ඉහත 1 හි දක්වා ඇති ප්‍රතිදානය හැර | 2·0 |
| 3. මුළු සහනාධාරය (ශුද්ධ) | 377·4 |

2. මේ සංඛ්‍යා II උ 5 සංඛ්‍යා සටහනෙහි ආහාර සහනාධාරයෙහි සංඛ්‍යා අතර වෙනස්කම් මෙසේය.

(1) සංඛ්‍යා දෙකොටස කෙළින්ම සැසඳීම හේතු යුක්ත වනුයේ තාවකාලික සංඛ්‍යා, නියම වලට වඩා සැළකිය යුතු ලෙස වෙනස් නොවන්නේ නම් පමණකි.

1963/64 ආනයන සහල් විකිණීමෙන් ඇතිවූ පාඩුව සඳහා දිය හැකි පිළිතුර වනුයේ, එම සහල් ගොඩබාන විට වන මිල වැඩිවීමය. 1962/63 දී බුරුමයෙන් ගෙන්වන ලද සහල් ටොන් එකක් (දිගු) ගොඩබාන විට, රු. 546 ක් මිල විය. 1963/64 දී එය රුපියල් 579 ක් මිල විය. මේ අනුව ටොන් එකකින් රු. 29 ක වැඩි වීමක් දක්වෙයි. චීනයෙන් ගෙන්වන සහල් ද 1962/63 දී ටොන් එකක් රු. 541 ක් වූ අතර, 1963/64 දී රු 565/- ක් විය. මෙය ටොන් එකකට රු.·24 ක වැඩිවීමකි. මෙරට සහල් වලින් වූ පාඩුව වැඩි වූයේ වැඩි වශයෙන් මිලයට ගැනීම සහ විකිනීම නිසාය.

ආහාර ආධාර වියදම (ශුඩ) වැඩිවීමට හේතු වූ ප්‍රධාන සාධකය වී ඇත්තේ සීනි විකිනීමෙන් ලද ලාභය රුපියල් කෝටි 7·95 කින් වැඩිවීමය. මෙයට හේතු වූයේ සීනි වල සිල්ලර මිල නොවෙනස්ව තිබිය දී සුදු සීනි ගන්නා මිල මෙම මුදල් වර්ෂය තුලදී දෙගුණයකින් පමණ වැඩිවීමය. 1963/64 දී සුදු සීනි ගොඩබාන සාමාන්‍ය මිල දිගු ටොන් එකකට රුපියල් 1135 ක් විය. 1962/63 දී එය රුපියල් 637 ක් විය.(1)

1963/64 දී පිටි විකිණීමෙන් ලැබුණ ලාභය රුපියල් කෝටි 2·6 කින් පහල වැටිණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ජීවන වියදම පහත හෙළීම සඳහා ගත් ක්‍රියා මාර්ගයක් වශයෙන් පිටි රාත්තලක මිල ශත 28 සිට ශත 23 දක්වා ශත 5 කින් අඩු කිරීම. ඕස්ට්‍රේලියාවෙන් ගෙන්වන පිටි ටොන් එකක් (දිගු) ගොඩබාන විට මිල 1962/63 දී රු පියල් 481 කේ සිට 1963/64 දී රු 530 දක්වා වැඩි වීමද මෙමගින් ලාභ අඩුවීමට හේතු විය.

1963/64 දී සහතික මිල ක්‍රමය යටතේ මිලට ගත් වී ප්‍රමාණය බුසල් 2,91,75,794 ක් විය. 1962/63 දී එය බුසල් 2,77,59,722 ක් විය. මේ අනුව බුසල් 14,16,072 ක් වැඩිවීමක් දක්වෙයි.

**ප්‍රාග්ධන වියදම**

ප්‍රාග්ධන වැය සම්මත සඳහා වූ නියම වියදම (එනම්, අය-වැය ලේඛනයේ දැක්වුන වියදම් වලින් 3, 5 සහ 7 වැනි වැය සම්මත වල එකතුව) 1963/64 රුපියල් කෝටි 40·02 ක් විය. මෙයට තේ හා රබර් නැවත වගා කිරීමෙ ආධාර අරමුදල් පිළිබඳ අධි අය-වැය පැහැදම් හා ආවර්තන වියදම් යටතේ වූ ප්‍රාග්ධන ශීර්ෂ යනාදිය එකතු කල විට 1963/64 මුළු ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 50·33 ක් වෙයි (තාවකාලික). මෙය, II (උ) 4 වැනි සංඛ්‍යා සටහනෙහි වර්ෂය පිළිබඳව දක්වා ඇති මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් කෝටි 13·61 කින් අඩු වන නමුදු 1962/63 නියම වියදමට වඩා රුපියල් කෝටි 1·43 කින් වැඩිවිය. පසුගිය මුදල් වර්ෂයත් සමග සසඳා බලන කල, මූර්ත වත්කම් අත්පත් කර ගැනීම, ඉදි කිරීම් හා නඩත්තු කිරීම් සඳහා වූ ප්‍රාග්ධන වියදම රුපියල් කෝටි 1·33 කින් පහල වැටුන අතර, මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම රුපියල් කෝටි 2·66 කින් වැඩිවිය. මූර්ත වත්කම් අත්පත් කර ගැනීම ඉදිකිරීම හා නඩත්තු කිරීම සඳහා වූ ප්‍රාග්ධන වියදම් අඩුවීමට හේතු දැක්වීමට තරම් සෑහෙන තොරතුරු තවමත් ලැබී නැත. රාජ්‍ය නියෝජ්‍යත්වයන්ට දෙන ලද ණය ඇතුලත් මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, ජාතික නිවාස අරමුදල හා ලෝහෝර් ආර්යා ණය අරමුදලට ණය සැපැයීම හා ලංකා බැංකුවේ සාමාන්‍ය කොටස් වෙනුවෙන් කොටස් හිමියනට වන්දි ගෙවීම හේතු කොට ගෙනය.

(1) 1963 වාර්ෂික වාර්තාවේ 92 වැනි පිටුවේ සඳහන් පරිදි 1962/63 දී සුදු සීනි දිගු ටොන් එකක් ගොඩ බෑම සඳහා ඇස්තමේන්තු කැරුන සාමාන්‍ය වියදම රුපියල් 1193 මුත් ඉහත දක්වා ඇති පරිදි දිග ටොන් එකක් රු. 637 ක් සේ දැනට සංශෝධනය කොට ඇත.

**අත්තිකාරම් ගිණුම් ගනුදෙනු**

1963/64 දී අත්තිකාරම් ගිණුම් පිළිබඳ ගනුදෙනු වලින් රුපියල් කෝටි 1·61 ක ශුද්ධ ලැබීමක් ඇතිවිය. 1962/63 දී එය රුපියල් කෝටි 1·37 ක් වූයේය. එසේ රුපියල් කෝටි 1·61 ක ශුද්ධ ලැබීමක් ඇතිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ රජයේ දෙපාර්තමේන්තු වලට දෙන ලද රුපියල් කෝටි 4·59 ක අත්තිකාරමකින් සමහන් වී ගිය, රබර්/සහල් වෙළඳ ගිවිසුම යටතේ චීනය කෙරෙහි වූ ලංකාවේ වගකීම් රුපියල් කෝටි 6·10 කින් වැඩි වීමය.

**මුදල් ගනුදෙනු පිළිබඳ ශුද්ධ හිඟය**

1963/64 මුදල් ගනුදෙනු පිළිබඳ ශුද්ධ හිඟය (නියම) රුපියල් කෝටි 46·24 ක් විය. එය රුපියල් කෝටි 41·80 ක් වූ මුල් ඇස්තමේන්තුවට වඩා රුපියල් කෝටි 4·44 කින් වැඩිය. එම වර්ෂය සඳහා මුලින් ඇස්තමේන්තු කරන ලද ප්‍රමාණයට වඩා ශුද්ධ මුදල් හිඟය (නියම) වැඩි වූයේ ආදායම රුපියල් කෝටි 3·41 කින් අඩු වීමත්, අත්තිකාරම් ගිණුම් ගනුදෙනු වලින්(1) ලද රුපියල් කෝටි 1·61 ක ශුද්ධ ලැබීමෙන් සමහන් වී ගිය ද ආදායම රුපියල් කෝටි 2·65 කින් වැඩිවීමත් හේතු කොටගෙනය. මෙය 1962/63 මුදල් වර්ෂයේ ඇති වූ පිළිවෙළට වඩා හාත්පසින් ම වෙනස්ය. එම වර්ෂයේ දී එකතු වූ ආදායම දැඩි ලෙස පහළ බැස තිබිය දීත් ශුද්ධ මුදල් හිඟය (නියම) මුල් ඇස්තමේන්තු වලට වඩා අඩු විය. 1963/64 මුල් ඇස්තමේන්තු සමග සසඳන කල, මුළු වියදම වැඩි වූයේ, ප්‍රාග්ධන වියදම් රුපියල් කෝටි 11·62 කින් අඩුවීමෙන්, සමහන් වී ගිය ද, ආවර්තන වියදම(2) රුපියල් කෝටි 14·25 කින් වැඩිවීම හේතු කොට ගෙනය. එම වර්ෂයේ ඇස්තමේන්තු වල සියයට ගණනක් වශයෙන් විස්තර කළ හොත් ආවර්තන වියදම යටතේ වූ වැඩිවීම සියයට 8·4 ක් වන අතර, ප්‍රාග්ධන වියදමේ අඩුවීම සියයට 22·5 ක් වන්නේය.

1962/63 ශුද්ධ මුදල් හිඟය සමග සසඳ බලන කල 1963/64 ශුද්ධ මුදල් හිඟය රුපියල් කෝටි 7·07 කින් වැඩිය. මෙයට හේතු වූයේ, ආදායම රුපියල් කෝටි 16·01 කින් වැඩිවීමෙන්, සමහන් වී ගියද ආවර්තන වියදම රුපියල් කෝටි 23·54 කින් වැඩිවීම, අත්තිකාරම් ගිනුම් ගනුදෙනු යටතේ වූ ශුද්ධ ලැබීම් රුපියල් කෝටි 0·24 කින් වැඩිවීම හා ප්‍රාග්ධන වියදම් රුපියල් කෝටි 0·12 කින් වැඩිවීමය.

**හිඟය පියවීම**

ශුද්ධ අය-වැය හිඟය පියැවුන ආකාරය (මාර්ග අනුව) හා එහි ප්‍රාසාරණාත්මක බලපෑම් ඉකුත් මුදල් වර්ෂයේ අනුරූප සංඛ්‍යා තොරතුරු සමග II (උ) 7 වැනි සංඛ්‍යා සටහනේ දැක්වේ

සංඛ්‍යා සටහන II (උ) 7

**හිඟය පියවූ ආකාරය**

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 | | | 1963/64 (තාවකාලිකයි) | | |
|---|---|---|---|---|---|---|
| 1. පරිපාලන ණය ගැනීම .. .. | | | —33·8 | | | 1·1 |
| 2. විදේශ මුදල් .. .. .. | | | | | | |
| (අ) ණයට ගත් .. .. | | | | | | |
| (i) ණයට ගත් ප්‍රමාණය (දළ) .. | 68·7 | | | 75·7 | | |
| (ii) නැවත ගෙවීම් හැර .. | 6·3 | 62·4 | | 10·7 | 65·0 | |
| (ආ) දීමනා .. .. | | 31·1 | 93·5 | | 31·8 | 96·8 |
| 3. බැංකු නොවන, දේශීය වෙළෙඳ පොළෙන් ගත් ණය | | | | | | |
| (අ) ණයටගත් ප්‍රමාණය දළ වශයෙන් .. | | 193·9 | | | 252·2 | |
| (ආ) නිදන් අරමුදල් දීමනා හැර .. | | 40·4 | 153·5 | | 46·1 | 206·1 |
| 4. දේශීය වෙළෙඳ පොළේ බැංකු ක්‍රමයෙන් ගත් ණය .. | | | 178·1 | | | 115·2 |
| 5. රජයේ මුදල් ශේෂ අඩුවීම (රින ලකුණ වැඩිවීමෙක් දක්වයි) .. | | | 0·4 | | | 45·4 |
| 6. ශුද්ධ අය-වැය හිඟය .. ., | | | 391·7 | | | 462·4 |
| 7. එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් අඩුවීම (රින ලකුණ වැඩිවීමෙක් දක්වයි) .. | | | 16·5 | | | 2·3 |
| 8. අය-වැය ලේඛනයේ ශුද්ධ ප්‍රාසාරණාත්මක බලපෑම (4+5+7) .. | | | 162·0 | | | 162·9 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1963/64 මුදල් වර්ෂයේ රුපියල් කෝටි 46·24 ක් වූ ශුද්ධ අය-වැය හිඟය පියවීම සඳහා බැංකු නොවන දේශීය මාර්ග වලින් රුපියල් කෝටි 20·61 ක්ද, බැංකු ක්‍රමයෙන් රුපියල් කෝටි 11·52 ක්ද, ණය ලබාගත් අතර විදේශාධාර වලින් රුපියල් කෝටි 9·68 ක්ද, රජයේ මුදල් ශේෂ අඩු කිරීමෙන් රුපියල් කෝටි 4·54 ක්ද, ලබා ගන්නා ලදී. මේ අතර, පරිපාලන ණය ගැනීම් වශයෙන් රුපියල් කෝටි 0·11 ක් ආපසු ගෙවා (ශුද්ධ) තිබිණි.

1963/64 නියම ශුද්ධ අය-වැය හිඟය, මෙම කොටසේ කලින් සඳහන් කළ හේතූන් නිසා ඉකුත් මුදල් වර්ෂයට වඩා රුපියල් කෝටි 7·07 කින් වැඩිවී ඇත. එහෙත් එ. ජ. ප්‍රතිපාර්ගවිය ආධාර අරමුදල්හි වෙනස්වීම් සඳහා ගැලපූ කළ 1963/64 හිඟයේ ප්‍රසාරණාත්මක බලපෑම ඉකුත් මුදල් වර්ෂයේදීට වඩා වැඩිවී ඇත්තේ ශුද්ධ අයවැය හිඟයේ වැඩිවීමට වඩා අඩු ප්‍රමාණයකිනි. 1963/64 ප්‍රාසාරණාත්මක බලපෑම රුපියල් කෝටි 16·29 ක් විය. මෙය 1962/63 ට වඩා වැඩි වූයේ රුපියල් කෝටි 0·09 කින් පමණි. මෙම තත්ත්වය ඇති කර ගැනීමට බෙහෙවින්ම ඉවහල්වූයේ බැංකු නොවන දේශීය මාර්ග වලින් ගත් ණය වැඩිවීමය. එමගින්, බැංකු ක්‍රමයෙන් වූ රජයේ ණය ගැනීම් රුපියල් කෝටි 6·29 කින් පමණ අඩුකර ගැනීමට හැකිව ඇත. මෙලෙසින් හිඟය පියවීම, මුදල් ශේෂ ආපසු ලබා ගැනීම් (රුපියල් කෝටි 4·5) වැඩිවීමෙන්ද එ. ජ. ප්‍රතිපාර්-ගවිය ආධාර අරමුදල් අඩුවීමෙන්ද මැකී ගියේය.

බැංකු ක්‍රමයෙන් ගත් ණය ප්‍රමාණය රුපියල් කෝටි 11·52 ක් විය. මෙය ඉකුත් මුදල් වර්ෂයේ සංඛ්‍යාව හා මැනවින් සැසඳේ. 1963/64 ගත් මුළු ණය වලින් රුපියල් කෝටි 14·25 ක්ම මහ බැංකුවෙන් ගනු ලැබිය. එහෙත් වෙළඳ බැංකු වලින් ගත් ණය රුපියල් කෝටි 2·73 කින් අඩුවූ නිසා එය සමහන් විය. වැඩිවූ මහ බැංකු ණය සඳහා මහ බැංකුවට විකුණූ භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 16.43 කින් වැඩවීම හා රජයට දෙන ලද මහ බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 1·54 කින් අඩුවීම හේතු විය. වෙළඳ බැංකු ණය අඩු වූයේ වෙළඳ බැංකු වෙතැති භාණ්ඩාගාර බිල් හා බදු සංචිත සහතික පිලිවෙලින් රුපියල් කෝටි 5·47 කින් හා රුපියල් කෝටි 0·04 කින් අඩුවීමත් හා රුපියල් සුරැකුම් පත් අයිතිය රුපියල් කෝටි 2·71 කින් වැඩිවීමත් හේතු කොට ගෙනය.

1963/64 වර්ෂය සඳහා වෙළඳ පොළේ, බැංකු නොවන මාර්ගයන්ගෙන් ගත් ණය (ශුද්ධ) රුපියල් කෝටි 20·61 ක් විය. මෙය 1962/63 වර්ෂයේ ගත් ප්‍රමාණයට වඩා වැඩිවූ ප්‍රමාණයකි. එසේම මෙය, 1960/61 දී බැංකු නොවන මාර්ගයෙන් ගත් රු. කෝටි 16·52 ට හා 1961/62 දී ගත් රුපියල් කෝටි 10·94 ට වඩා වැඩිය. මෙසේ 1963/64 දී ගත් ප්‍රමාණය වාඩිවීමට, ඉතිතිකිරීම් ආයතන, සේවක අර්ථ සාධක අරමුදල, රක්‍ෂණ අරමුදල් (රක්‍ෂණ සමායතන ඇතුළුව) සහ අනිකුත් සමායතන හා සමාගම් වලින් දෙන ලද ප්‍රමාණය වැඩිවීම හේතු විය. මේ වර්ෂ සඳහා ඇතිවූ වෙනස්කම් ඇතුළුව දේශීය වෙළඳ පොළෙන් ගත් ණය පිළිබඳ විග්‍රහයක් 1963/64 රාජ්‍ය ණය පිළිබඳ විස්තර ඇතුලත් කොටසෙහි දක්වා ඇත.

රජයේ සුරැකුම් (භාණ්ඩාගාර බිල්පත් සහ බදු සංචිත සහතික ඇතුළුව) සඳහා දී ඇති දායක දීමනා ප්‍රධාන ආයෝජන පන්ති අනුව වර්ග කොට 2 (උ) 8 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (ඌ) 8

**බැංකු නොවන ප්‍රධාන ආයෝජන ගණ විසින් රජයේ සුරැකුම්පත් වෙනුවෙන් කැරුන දායක දීමනා**

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 | 1963/64 | ශුද්ධ වෙනස |
|---|---|---|---|
| 1. ඉතිරි කිරීම් ආයතන .. | 14·3 | 28·9 | 14·6 |
| 2. සේවක අර්ථසාධක අරමුදල .. | 61·7 | 65·6 | 3·9 |
| 3. අනෙකුත් අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් .. | 31·2 | 22·0 | –9·2 |
| 4. රක්ෂණ අරමුදල් * .. | 22·4 | 36·6 | 14·2 |
| 5. අනෙකුත් රජයේ සමායතන .. | — | 3·5 | 3·5 |
| 6. අනෙකුත් සමාගම් .. | 5·0 | 12·2 | 7·2 |
| 7. සමාජ හා ආයතන .. | 0·1 | — | –0·1 |
| 8. පුද්ගලයන් .. | 0·1 | 1·3 | 1·2 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* රක්ෂණ සමායතන විසින් කැරුන දායක දීමනා ඇතුළත් වේ.

## විදේශීය මුදල්

1963/64 දී ප්‍රාග්ධන වියදම සඳහා ලැබුණු විදේශීය ආධාර රු. කෝටි 10·75 ක් විය. 1962/63 මේ සම්බන්ධයෙන් රු. කෝටි 9·98 ක් ද, 1961/62 දී රු. කෝටි 6·26 ක් ද, 1960/61 දී රු. කෝටි 2·96 ක් ද ලැබී ඇත. මේ සිව් වසර තුළ ගෙවන ලද දිදේශීය ණය 1963/64 දී රු. කෝටි 1·07 ක් ද, 1962/63 දී රු. කෝටි ·63 ක් ද, 1961/62 දී රු. කෝටි 6·8 ක් ද, 1960/61 දී රු. කෝටි ·30 ක් ද විය. විදේශ වලින් ලැබුණ ණය සහ දීමනා (2 (ඌ) 9 සංඛ්‍යා සටහන බලන්න) වැඩිවීමෙන් විදේශීය ආධාර වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගත් බව දැක්වෙන්නේ වුවද, මුල් බලාපොරොත්තු වූ ප්‍රමාණය සහ වෙන් වශයෙන් ලැබුණු ප්‍රමාණය අතර වෙනසක් පවත්නේය. ලැබෙන ආධාර, ඒ හා සමාන වියදමක් සඳහා සම්බන්ධව පවතින කල්හි විදේශීය ආධාර අඩු වීම හිඟය පියවීමේදී වෙනසක් නොකැරෙන අතර ප්‍රාග්ධන සම්පාදනයේදී සහ ආර්ථික සංවර්ධනයේදී ආධාර අඩු වශයෙන් ප්‍රයෝජනයට ගැනීම තරමක් සැලකිය යුතු කරුණකි. 1960/61 වර්ෂයේ සිට ලැබුණ විදේශාධාර පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (ඌ) 9

**ලැබුණු විදේශාධාර**

රුපියල් දශ ලක්ෂ

| | 1960/61 ලැබීම් (ශුද්ධ) | 1961/62 ලැබීම් (ශුද්ධ) | 1962/63 ලැබීම් (ශුද්ධ) | 1963/64 ලැබුණු ප්‍රමාණය | 1963/64 ගෙවන ලද ප්‍රමාණය | 1963/64 ලැබීම් (ශුද්ධ) |
|---|---|---|---|---|---|---|
| ණය: | | | | | | |
| 1. ජා. ප්‍ර. ස. බැංකුව .. .. | 9·2 | 25·6 | 21·2 | 15·7 | 4·4 | 11·3 |
| 2. කැනඩාව .. .. | — | – 1·3 | 0·8 | 1·0 | 1·2 | – 0·2 |
| 3. චීනය .. .. | — | – 1·0 | — | 13·4 | 1·0 | 12·4 |
| 4. එ. රා. .. .. | — | 3·3 | 11·9 | 9·0 | 2·6 | 6·4 |
| 5. ඇ. එ. ජ. .. .. | 2·4 | 7·6 | – 0·7 | 3·8 | 1·1 | 2·7 |
| 6. සෝ. ස. ස. සංගමය .. | 1·8 | 3·4 | 13·5 | 32·0 | — | 32·0 |
| 7. බටහිර ජර්මනිය .. .. | — | — | 11·5 | 0·4 | — | 0·4 |
| 8. යුගෝස්ලෝවියාව .. .. | — | — | 4·3 | 0·5 | 0·4 | .... |
| දීමනා: | | | | | | |
| කොළඹ ක්‍රමය | | | | | | |
| 1. ඕස්ට්‍රේලියාව .. .. | 3·8 | — | 2·5 | — | | — |
| 2. කැනඩාව .. .. | 4·2 | 4·4 | 5·7 | 4·4 | | 4·4 |
| 3. නිවසීලන්තය .. .. | — | — | — | — | | — |
| අනෙකුත් | | | | | | |
| 1. චීනය .. .. .. | — | 8·3 | 19·7 | 24·5 | | 24·5 |
| 2. ඇ. එ. ජ .. .. | 5·3 | 1·6 | 0·9 | 1·4 | | 1·4 |
| 3 බටහිරජ ර්මනිය .. .. | — | 3·8 | 2·3 | — | | — |
| මුළු ණය සහ දීමනා .. | 26·6 | 55·8 | 93·5 | 107·5 | 10·7 | 96·8 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

**රාජ්‍ය ණය.**

දේශීය හා විදේශීය රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා තොරතුරු දෙවැනි පරිශිෂ්ටයේ 24 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. පසුගිය මුදල් වර්ෂ පහේ එක් එක් වර්ෂයේ අවසානයට තිබූ දේශීය හා විදේශීය මුළු රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා පහත දැක්වේ.

සංඛ්‍යා සටහන II (උ) 10

මුළු රාජ්‍ය ණය (1)

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයට | මුළු දළ ණය | පසුගිය මුදල් වර්ෂයට වඩා වැඩිවීම | ශුද්ධ ණය (නිදන් අරමුදල් වටිනාකම හැර) | පසුගිය මුදල් වර්ෂයට වඩා වැඩිවීම |
|---|---|---|---|---|
| 1960 .. .. .. | 2,230·4 | 393·4 | 1,912·8 | 392·1 |
| 1961 .. .. .. | 2,651·0 | 420·6 | 2,332·7 | 419·9 |
| 1962 .. .. .. | 3,038·9 | 387·9 | 2,688·9 | 356·2 |
| 1963 .. .. .. | 3,547·3 | 398·4 | 3,065·4 | 376·5 |
| 1964 .. .. .. | 3,787·4 | 350·1 | 3,436·0 | 370·6 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව.

1963/64 මුදල් වර්ෂයේ දී දළ ණය රුපියල් කෝටි 35·01 කින්ද, ශුද්ධ ණය රුපියල් කෝටි 37·06 කින්ද වැඩි විය. ඊට ප්‍රථම අවුරුද්දේ මේ ණය පිළිවෙලින් රුපියල් කෝටි 39·84 කින් හා රුපියල් කෝටි 37·65 කින් වැඩිවී ඇත. 1963/64 මුදල් වර්ෂයේදී දළ ණය ප්‍රමාණයෙහි ඇතිවූ වැඩිවීම පසුගිය මුදල් වර්ෂ පහේදී දක්නට ලැබුන කුඩාම වාර්ෂික වැඩිවීම වෙයි.

දළ ණය රුපියල් කෝටි 35·01 කින් වැඩිවීමට හේතු වූයේ, රුපියල් සුරැකුම් පත් රුපියල් කෝටි 22·58 කින්ද, භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 12·5 කින්ද, බදු සංචිත සහතික රුපියල් කෝටි 1·34 කින්ද, විදේශීය ණය රුපියල් කෝටි 0·5 කින්ද වැඩිවීම හා රුපියල් කෝටි 1·92 ක මහ බැංකු අත්තිකාරම් ආපසු ගෙවීමය (ශුද්ධ).

**දේශීය ණය.**

1963/64 මුදල් වර්ෂය අවසාන වන විට දළ දේශීය ණය රුපියල් කෝටි 337·53 ක්ව තිබිණි. එදිනට මේ ණය සැකසී තිබුනේ මෙසේය.- රුපියල් ණය රුපියල් කෝටි 190·94, භාණ්ඩාගාර බිල්පත් රුපියල් කෝටි 125·0, බදු සංචිත සහතික රුපියල් කෝටි 3·25, මහබැංකු අත්තිකාරම් රුපියල් කෝටි 18·33 සහ ජාතික සංවර්ධන පිළිනපත් රුපියල් කෝටි 0·01 යි. දේශීය රාජ්‍ය ණය සැකැසීම සම්බන්ධයෙන් ඇතිවූ වෙනස්කම් 1962/63 වර්ෂය හා සසඳ පහත එන සංඛ්‍යා සටහනේ බෙදා දක්වා ඇත.

(1) මේ රාජ්‍ය ණය සංඛ්‍යා වලට, 1964 සැප්තැම්බර් අවසානය වන විට තිබූ, රුපියල් කෝටි 7·5 ක ජාතික නිවාස ණයකර සහ රුපියල් කෝටි 4·33 ක රජයේ උකස් බැංකු ණයකරද ඇතුළත් නොවේ.

## සංඛ්‍යා සටහන II (උ) 11

## දේශීය රාජ්‍ය ණය සැකසුම.

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයේදී | රුපියල් ණය | | | භාණ්ඩාගාර බිල්පත් | බදු සංචිත සහතික | මහ බැංකු අත්තිකාරම (2) | ජාතික සංවර්ධන පිළිනපත් (3) | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ | නිදන් අරමුදල් (1) | ශුද්ධ | | | | | දළ | ශුද්ධ |
| 1963 | 1683·6 | 276·3 | 1407·3 | 1125·0 | 19·1 | 202·5 | . . . | 3030·2 | 2753·9 |
| 1964 | 1909·4 | 312·8 | 1596·6 | 1250·0 | 32·5 | 183·3 | 0·1 | 3375·3 | 3062·5 |
| වෙනස (4) | +225·8 | +36·5 | +189·3 | +125·0 | +13·4 | —19·2 | +0·1 | +345.1 | +308·6 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1 නිදන් අරමුදල වෙනුවෙන් ඇති අයෝජන වල වෙළෙඳ වටිනාකම පිළිබිඹු වෙයි. (අනුපූරික නිදන් අරමුදල් ඇතුළුව)

2 1963 සැප්තැම්බර් මාසයේදී රුපියල් කෝටි 3·95 ක් වූ විශේෂ ණය සහ 1964 සැප්තැම්බර් මාසයේදී රුපියල් කෝටි 3·97 ක් වූ විශේෂ ණයද ඇතුලත් වෙයි.

3 1963 සැප්තැම්බර් අවසානය වන විට නිකුත්කර තිබුන හා ගෙවීමට තිබුන ජාතික සංවර්ධන පිළිනපත් වල වටිනාකම රුපියල් 36,320 ක් විය.

4 + ලකුණෙන් වැඩිවීමක් දක්වෙයි.

1964 සැප්තැම්බර් අවසානයට දළ දේශීය ණය කල් පිරෙන පිළිවෙල, පසුගිය මුදල් වර්ෂවල ඒ පිළිබඳ සංඛ්‍යා තොරතුරුද සමග සංඛ්‍යා සටහන II (උ)12 හි දක්වෙයි. පසුගිය මුදල් වර්ෂය තුලදී දේශීය ණය පිළිබඳ කාල ආකෘතිය දිග්ගැසී ඇති බැව් එම සංඛ්‍යා සටහනෙන් පිළිබිඹු වෙයි. 1963/64 මුදල් වර්ෂයේ මුළු දේශීය ණය වලින් සියයට 30·9 ක් කල් පිරෙන අවසාන දිනයට, අවුරුදු 15 කට වැඩි දේශීය ණය වූයේය. සියයට ගණනින් බලනවිට එය 2·9 ක වැඩිවීමකි. එමෙන්ම 1964 සැප්තැම්බර් අවසානය වන විට, කල් පිරීමට අවුරුදු 5 ට අඩු ණය, සියයට ගණනින් 3·1 කින් සියයට 49·5 දක්වා අඩුවිය.

### රුපියල් සුරැකුම් පත්.

පසුගිය මුදල් වර්ෂ පහ තුල ගන්නා ලද ණය සහ ගෙවන ලද ණය පහත සටහනේ වේ.

රුපියල්

| මුදල් වර්ෂය | ගන්නා ලද ණය | ගෙවන ලද ණය |
|---|---|---|
| 1959/60 .. .. .. .. | 19,50,00,000 | 5,52,39,200 |
| 1960/61 .. .. .. .. | 26,95,83,200 | 8,97,48,800 |
| 1961/62 .. .. .. .. | 19,36,99,600 | 7,50,00,000 |
| 1962/63 .. .. .. .. | 22,13,25,700 | 5,30,81,000 |
| 1963/64 .. .. .. .. | 31,50,00,000 | 8,91,48,300 |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

## සංඛ්‍යා සටහන II (උ) 12

## දේශීය ණය – කල් පිරීම් අනුව

## (සැප්තැම්බර් අවසානයේදී)

| කල් පිරුන කාලය අවුරුදු (1) | 1960 | | 1961 | | 1962 | | 1963 | | 1964 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රු. දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රු. දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රු. දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රු. දශලක්ෂ | සියයට ගණන |
| 5 ට අඩු .. .. .. .. | 1,050·5 | 54·2 | 1,218·6 | 52·0 | 1,451·1 | 53·9 | 1,592·8 | 52·6 | 1,671·8 | 49·5 |
| 5 ට හා 10 අතර .. .. .. | 127·5 | 6·6 | 185·1 | 7·9 | 229·5 | 8·5 | 365·4 | 12·1 | 445·0 | 13·2 |
| 10 ට හා 15 අතර .. .. .. | 295·0 | 15·2 | 230·2 | 9·8 | 180·2 | 6·7 | 222·9 | 7·4 | 216·6 | 6·4 |
| 15 ට වැඩි .. .. .. . | 463·6 | 23·9 | 710·1 | 30·3 | 832·8 | 30·9 | 849·1 | 28·0 | 1,042·0 | 30·9 |
| එකතුව .. .. .. | 1,936·7 | 100·0 | 2,344·0 | 100·00 | 2,693·7 | 100·0 | 3,030·2 | 100·0 | 3·375·3 (2) | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(1) කල්පිරෙන අවසාන දිනය දක්වා

(2) නිකුත් කළ හා නොබේරන ලද ජාතික සංවර්ධන බැඳුම් කර වල වටිනාකම වූ රුපියල් කෝටි 0·01 ක් ඇතුළති. කල් පිරෙන නියමිත දින යක් නැති බැවින්, මේ ප්‍රමාණය ඉහත දක්වෙන සතර වැදගත් ශීර්ෂයනට ඇතුළත් කළ නොහැක.

## සංඛ්‍යා සටහන II (උ) 13

### 1963/64 රජයේ සුරැකුම්පත් බෙදීගිය අයුරු

රුපියල් දශ ලක්ෂ

| | 1984–88 'ඩී' කාණ්ඩය 4½% ණය | 1984–88 'ඊ' කාණ්ඩය 4½% ණය | 1985–89 4½% ණය | 1985–89 'බී' කාණ්ඩය 4½% ණය | 1985–89 'සී' කාණ්ඩය 4½% ණය | 1985–89 'ඩී' කාණ්ඩය 4½% ණය | 3¾% ණය 1974* | | 1985–89 'ඊ' කාණ්ඩය 4½% ණය | 1985–89 'එfජ' කාණ්ඩය 4½% ණය | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | හැරවීම | මුදල් | | | ප්‍රමාණය | සියයට ගණන |
| වෙළෙඳ බැංකු .. | 6·0 | — | — | 10·0 | 10·0 | 2·0 | — | — | 5·0 | — | 33·0 | 10·5 |
| ඉතිරි කිරීමේ ආයතන .. | 2·4 | 3·5 | 3·5 | 2·0 | 1·0 | 2·5 | 52·5 | — | 11·0 | 1·5 | 79·9 | 25·4 |
| නිදන් අරමුදල් .. | 1·4 | 6·3 | 11·0 | 8·2 | 4·1 | 8·3 | — | — | 6·6 | 0·4 | 46·3 | 14·7 |
| දෙපාර්තමේන්තු හා අනෙකුත් කාර්යාලයීය අරමුදල් .. | 1·2 | 1·6 | 0·1 | 0·4 | 2·4 | — | 10·3 | — | 2·4 | 3·0 | 21·4 | 6·8 |
| භාරකාර මණ්ඩල, අර්ථසාධක, සුභසාධක සහ විශ්‍රාම වැටුප් හා අරමුදල් .. | | | | | | | | | | | | |
| (1.) සේවක අර්ථසාධක අරමුදල .. | 8·5 | 8·1 | 8·5 | 5·1 | 5·9 | 8·2 | — | — | 13·9 | 6·8 | 65·0 | 20·6 |
| (2.) අනෙකුත් .. | 2·0 | 6·2 | 2·9 | 1·1 | 1·3 | 1·6 | 1·1 | 1·9 | 3·1 | 4·6 | 25·8 | 8·2 |
| රක්ෂණ අරමුදල් | | | | | | | | | | | | |
| (1.) රක්ෂණ සංස්ථාව .. | 2·5 | 1·0 | 3·3 | 3·1 | 4·2 | 4·9 | — | — | 7·3 | 2·7 | 29·0 | 9·2 |
| (2.) රක්ෂණ සමාගම් .. | 0·8 | 3·3 | 0·6 | — | 0·9 | 0·5 | 0·4 | 1·8 | — | 0·6 | 8·9 | 2·8 |
| අනෙකුත් රජයේ සමායතන .. | — | — | — | — | — | 1·9 | — | 1·6 | — | — | 3·5 | 1·1 |
| අනෙකුත් සමාගම් .. | — | — | 0·1 | — | — | — | ... | ... | — | 0·2 | 0·3 | 0·1 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන .. | 0·1 | ... | 0·1 | ... | 0·2 | ... | 0·2 | 0·1 | 0·7 | 0·3 | 1·7 | 0·5 |
| එකතුව | 25·0 | 30·0 | 30·0 | 30·0 | 30·0 | 30·0 | 64·5 | 5·5 | 50·0 | 20·0 | 315·0 | 100·0 |

* 1964 ජූලි 15 වැනිද ආපසු ගෙවීමට නියමව තිබූ 1965 සියයට 3¾ ලංකාණ්ඩුවේ ණය මුදල හැරවීමෙන් මෙම ණය ලබා ගන්නා ලදී.

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1963/64 මුදල් වර්ෂයේදී නිකුත් කරන ලද රුපියල් කෝටි 31·5 ක්වූ රුපියල් ණයපත් වලින් රුපියල් කෝටි 7·0 ක් සඳහා වූ ණයපත් හැරවුම් ණය වූ අතර, රුපියල් කෝටි 24·5 ක්වූ ඉතිරි ණය අට, මුදලින් ගනු ලැබීය. රුපියල් කෝටි 7·0 ක්වූ 1974 සියයට $3\frac{3}{4}$ (හැරවුම්) ණයපත් නිකුත් කරන ලද්දේ 1964 ජූලි මාසයේදී ගෙවීමට නියමිතව තිබූ රුපියල් කෝටි 7·0 ක්වූ, 1964 සියයට $3\frac{3}{4}$ ණයෙහි කොටසක් හරවා දීමෙනි. රුපියල් කෝටි 6·45 ක්වූ කල් පිරෙමින් තිබූ ණයෙහි ව්‍යාපාර වස්තු සියයට $3\frac{3}{4}$ හැරවුම් ණයෙහි ව්‍යාපාර වස්තු වෙනුවෙන් පවරා දීමෙන් පසු ඉතුරුව මුදල් වලින් ලබාගන්නා ලදී. අනිත් ණය නිකුතු අට මුලුමනින්ම මුදල් ලබාගැනීම සඳහා නිකුත් කරන ලදී. ණය පත් බෙදීගිය ආකාරය පිළිබඳ විග්‍රහයක් II (උ) 13 සංඛ්‍යා සටහනේ දක්වෙයි.

1963/64 ණයපත් නිකුතුවෙන් රුපියල් කෝටි 7·99 ක ණයපත් (සියයට 25·4 ක්) ම ඉතිරි කිරීම් ආයතන වලින් ගන්නා ලද බැව්, රජයේ සුරැකුම් පත් බෙදීගිය අයුරු දැක්වෙන II (උ) 13 වැනි සංඛ්‍යා සටහනින් දක්වෙයි. 1962/63 වර්ෂයේදී එකී ආයතන ලබාගත් ණය පත් ප්‍රමාණය රුපියල් කෝටි 1·73 ක් හෙවත් සියයට 7·8 ක් විය. 1963/64 දී නිකුත් කරන ලද ණයපත් වලින් ඉතිරි රුපියල් කෝටි 23·5 ක ණයපත් බෙදීගිය අයුරු මෙසේය:- සේවක අර්ථසාධක අරමුදල රුපියල් කෝටි 6.5 (සියයට 21), නිදන් අරමුදල් රුපියල් කෝටි 4·63 (සියයට 15), වෙළෙඳ බැංකු රුපියල් කෝටි 3·3 (සියයට 11), රක්ෂණ සංස්ථාව රුපියල් කෝටි 2·9 (සියයට 9) හා සේවක අර්ථසාධක අරමුදල් හැර "භාරකාර මණ්ඩල, සුභසාධක, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල්" රුපියල් කෝටි 2·58 (සියයට 8). බැංකු නොවන අයෝජකයන් විසින් රජයේ සුරැකුම් පත් මිලට ගැනීම 1963/64 මුදල් වර්ෂයේදී තවදුරටත් වැඩිවිය. එය වැඩිවූයේ වෙළෙඳ බැංකු වෙතැති පෞද්ගලික හිමිකම් තිබූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුද රුපියල් කෝටි 5·65 කින් වැඩිවී තිබියදීය. 1962/63 හා 1963/64 දී රජයේ සුරැකුම් පත් බෙදී ගිය ආකාරය වර්ග කොට, සසඳ පහත සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (උ) 14

**1962/63 සහ 1963/64 රජයේ සුරැකුම් පත් බෙදී ගිය අයුරු වර්ග කොට සැසඳීම.**

රුපියල් දශ ලක්ෂ

| | 1962/63 | | 1963/64 | | වෙනස |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය |
| වෙළෙඳ බැංකු .. .. .. | 25·4 | 11·5 | 33·0 | 10·5 | + 7·6 |
| සමුපකාර ප්‍රාදේශීය බැංකු .. .. | 0·3 | 0·1 | – | – | – 0·3 |
| ඉතිරි කිරීමේ ආයතන .. .. .. | 17·3 | 7·8 | 79·9* | 25·4 | +62·6 |
| නිදන් අරමුදල් .. .. .. | 36·4 | 16·4 | 46·3 | 14·7 | + 9·9 |
| දෙපාර්තමේන්තු හා අනෙකුත් කාර්යාලයීය අරමුදල් | 7·5 | 3·4 | 21·4 | 6·8 | +13·9 |
| භාරකාර මණ්ඩල, සුභසාධක සහ විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් | | | | | |
| 1. සේ. අ. අ. .. .. .. | 67·8 | 30·6 | 65·0 | 20·6 | – 2·8 |
| 2. අනෙකුත් .. .. .. | 36·6 | 16·5 | 25·8 | 8·2 | – 10·8 |
| රක්ෂණ අරමුදල් | | | | | |
| 1. රක්ෂණ සංස්ථාව .. .. .. | 12·9 | 5·8 | 29·0 | 9·2 | +16·1 |
| 2. රක්ෂණ සමාගම් .. .. .. | 13·4 | 6·1 | 8·9 | 2·8 | – 4·5 |
| අනෙකුත් රජයේ සමායතන .. .. | – | – | 3·5 | 1·1 | + 3·5 |
| අනෙකුත් සමාගම් .. .. .. | 0·8 | 0·4 | 0·3 | 0·1 | – 0·5 |
| පුද්ගලයන්, සමාජ හා ආයතන .. .. | 3·2 | 1·4 | 1·7 | 0·5 | – 1·5 |
| එකතුව .. .. .. | 221·3 | 100·0 | 315·0 | 100·0 | +93·7 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* මෙම ප්‍රමාණයෙන් රුපියල් කෝටි 5·25 ක්, 1974 සියයට $3\frac{3}{4}$ (හැරවුම්) ණය සඳහා වූ දායක මුදලින් සමන්විතයි.

**කල් පිරීම සහ පොළී අනුපාතිකය අනුව වර්ග කිරීම.**

කල්පිරීම අනුව වර්ග කිරීමේදී, රුපියල් කෝටි 24·5 ක වටිනාකම අවුරුදු 21 – 25 අතර කල්පිරීමට නියමිත ණය අටක් ගෙන ඇත. මේ ණය සියල්ලම ගන්නා ලද්දේ, 1963 ජූනි මාසයේ සිට එවැනි ණය සඳහා නියමිතව තිබූ පොළී අනුපාතිකය වන සියයට $4\frac{1}{2}$ පොළියටය. අවුරුදු දහයේ හැරවුම් ණය ගන්නා ලද්දේ සියයට $3\frac{3}{4}$ පොළියටය.

**භාණ්ඩාගාර බිල්පත්.**

මුදල් වර්ෂය අරඹන විට, නිකුත් කොට නොබේරා තිබුන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 112·5 ක් විය. එහෙත් එදිනට බලයලත් සීමාව රුපියල් කෝටි 115·0 ක් විය 1963 අංක 11 දරන මුදල් පනතේ 116 වැනි වගන්තියේ විධිවිධාන අනුව බලයලත් සීමාව රුපියල් කෝටි 10·0 කින් රුපියල් කෝටි 125·0 දක්වා වැඩි කරන ලදී. 1964–8–28 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සම්මුතියකින් බලය ලත් සීමාව රුපියල් කෝටි 25·0 කින් රුපියල් කෝටි 150 දක්වා නැවත වරක් වැඩි කරන ලදී. 1964–9–30 වැනි දින මුදල් වර්ෂය අවසන් වන විට නිකුත් කොට නොබේරා තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 125·0 ක් විය. මේ අනුව මුදල් වර්ෂය තුළ රුපියල් කෝටි 12·5 ක වැඩිවීමක් දක්වෙයි. මේ අනුව, මුදල් වර්ෂය අවසාන වන විට, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට හැකි සීමාවෙන් ප්‍රයෝජනයට නොගත් ශේෂය රුපියල් කෝටි 25·0 ක් විය.

1964 සැප්තැම්බර් අවසානයට මහ බැංකුව සතුව තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 115·32 ක් (නොබේරා තිබූ මුළු ප්‍රමාණයෙන් සියයට 92·2) විය. 1963 – 9 – 30 වැනි දිනට එය රුපියල් කෝටි 98·89 ක් (සියයට 87·9 ක්) විය.

සමාලෝචනයට භාජන වූ මුදල් වර්ෂය තුළදී, භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ පොළී අනුපාතිකය නොවෙනස්ව, අවුරුද්දට සියයට 2·80 අනුපාතිකයෙහි ම පැවැතිනා. එහෙත්, මහ බැංකුව විසින් මිල දී ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් සඳහා ලැබුනේ වර්ෂයකට සියයට 0·76 ක පොළියක් පමණි. මෙය රජයේ අය–වැය තත්ත්වය කෙරෙහි ඇති වන පීඩනය අඩු කරණු සඳහා ගන්නා ලද පියවරකි.

**විදේශීය ණය.**

1963/64 දී දළ විදේශීය ණය (ආපසු ගෙවීම් අඩු කිරීමෙන් පසු) රුපියල් කෝටි 0·5 කින් වැඩි විය. 1962/63 දී වැඩිවීම රුපියල් කෝටි 6·19 ක් විය. 1963/64 දී ඇති වූ වැඩිවීම II (උ) 15 වැනි සංඛ්‍යා සටහනෙහි විග්‍රහකර දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (උ) 15

**විදේශීය ණය.**

රුපියල් දශ ලක්ෂ

| | 1963/64 දි වැඩිවීම් | 1964 සැප්තැම්බර් 30 වැනි දිනට වගකීම් |
|---|---|---|
| ජාත්‍යන්තර ප්‍රතිසංස්කරන හා සංවර්ධන බැංකුව .. .. | 11·3 | 134·7 |
| කැනේඩියානු ණය .. .. | — 0·2 | 8·9 |
| චීන ණය .. .. | 12·4 | 21·6 |
| එක්සත් රාජධානියේ ණය මාලාව .. .. | 6·4 | 21·7 |
| එක්සත් රාජධානියේ රන් පවුම් සුරැකුම් පත් .. .. | —60·0 | 107·9 * |
| ඇමෙරිකා එක්සත් ජනපදයේ සංවර්ධන ණය අරමුදලේ ණය .. | — 0·8 | 11·7 |
| ඇමෙරිකා එක්සත් ජනපදයේ (අයි. සී. ඒ.) ණය .. | 3·6 | 35·2 |
| ස. ස. සෝ. සං. යේ ණය .. .. | 32·0 | 54·3 |
| බටහිර ජර්මන් ණය .. .. | 0·4 | 11·8 |
| යුගෝස්ලේවියානු ණය .. .. | ... | 4·3 |
| එකතුව .. .. | 5·0 | 412·1 * |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* පවුම් සුරැකුම්පත් බේරීම සඳහා පවත්වාගෙන යන ලද නිදන් අරමුදල රුපියල් කෝටි 3.86 ක් විය. මෙම නිදන් අරමුදල් සඳහා ගැලපීම් ඇති කිරීමෙන් පසු, ශුද්ධ වගකීම ප්‍රමාණය රුපියල් කෝටි 37.35 ක් විය.

**නිදන් අරමුදල්.**

රාජ්‍ය ණය බේරීම සඳහා නිදන් අරමුදලේ වෙළෙඳ වටිනාකම, 1963/64 මුදල් වර්ෂය අවසාන වන විට, රුපියල් කෝටි 35·14 ක්ව තිබිණි. 1962/63 මුදල් වර්ෂය අවසාන වන විට මෙය රුපියල් කෝටි 2·05 කින් අඩුවිය. අඩුවීම ඇති වූයේ පහත දැක්වෙන පරිදිය:-

| | | රුපියල් දශ ලක්ෂ |
|---|---|---|
| ණය ආපසු ගෙවීම සඳහා යොදවන ලද ප්‍රමාණය | 79·1 | |
| රජයට බැර කරන ලද නිදන් අරමුදලේ අතිරික්තය | 3·0 | 82·1 |

අඩුවීම.

| | |
|---|---|
| නිදන් අරමුදලට දායක දීමනා | − 46·0 |
| අයෝජන සඳහා පොලිය | − 14·8 |
| ආයෝජන වල වෙළෙඳ වටිනාකමෙහි අගය වැඩිවීම | − 0·8 |
| ශුද්ධ අඩුවීම | 20·5 |

**අර්ධ රාජ්‍ය ආයතන විසින් ගත් ණය.**

මහ බැංකුව ඉකුත් මුදල් වර්ෂයේදී අනුගමනය කළ ප්‍රතිපත්තියම අනුගමනය කළේ, ලබාගත හැකි සියලුම ධන මාර්ග රජයේ අවශ්‍යතා සඳහා යොදා දුන් අතර, ජාතික නිවාස කොමසාරිස්ට හා රජයේ උකස් බැංකුවට අවශ්‍ය මුදල් එම ආයතන දෙකේ අවශ්‍යතා හා රජයේ මුදල් තත්ත්වය අනුව ණය අරමුදල් වලින් ණයට දෙන ලෙස රජයට උපදෙස් දෙන ලදී.

### (I) ජාතික නිවාස දෙපාර්තමේන්තුව.

1963/64 දී ජාතික නිවාස ණයකර නිකුත් නොකැරිණි. එහෙත් රජය විසින් ජාතික නිවාස කොමසාරිස්වරයාට රුපියල් කෝටි 1·5 ක ණයක් අනුමත කැරිණි. මේ අනුව, 1963/64 මුදල් වර්ෂය අවසානයේදී නිකුත් කරන ලදුව බේරීමට ඉතිරිව ඇති ජාතික නිවාස ණයකරවල එකතුව රුපියල් කෝටි 7·5 ක් වූ අතර, රජය විසින් අනුමත කරන ලද අවක්‍ර ණය රුපියල් කෝටි 1·5 කින් රුපියල් කෝටි 7·0 දක්වා ඉහළ ගියේය. ජාතික නිවාස ණයකර බේරීම සඳහා අරඹන ලද නිදන් අරමුදල් වල වෙළෙඳ වටිනාකම රුපියල් කෝටි 2·33 ක්ව පැවතිනි.

### (II) රජයේ උකස් බැංකුව.

1963/64 වර්ෂයේ දී රජයේ උකස් බැංකුව අලුත් ණයකර නිකුත් නොකැරිණි. රජයේ උකස් බැංකුව සිය ගනුදෙනු කරගෙන යාමට බොහෝ සෙයින්ම අයිරාවන් පිහිට කොට ගනු ලැබීය. රජයේ උකස් බැංකු ආඥාපනතේ 35 වැනි වගන්තිය යටතේ රජයේ උකස් බැංකුවට ගත හැකි ණය සීමාව 1963/64 වසර තුළ රුපියල් කෝටි 0·26 කින් රුපියල් කෝටි 6·76 දක්වා වැඩි කරන ලදී. මුදල් වර්ෂය තුළදී, 1962/64 සියයට 2½ රජයේ උකස් බැංකු ණයකර සඳහා වූ රුපියල් කෝටි 0·5 ක්ද 1962/64 සියයට 2¾ රජයේ උකස් බැංකු ණයකර සඳහා වූ රුපියල් කෝටි 0·5 ක්ද ආපසු ගෙවන ලදී. මේ නිසා නිකුත් කරන ලදුව බේරීමට ඉතිරිව ඇති ණයකර රුපියල් කෝටි 3·33 දක්වා අඩුවිය. 1964 සැප්තැම්බර් 30 වෙනි දිනට අයිරා පිට ගණු ලැබූ ප්‍රමාණය රුපියල් කෝටි 2·43 ක් විය. මේ අනුව මුදල් වර්ෂය අවසානයේදී බැංකුවේ මුළු ණය ගැති කම රුපියල් කෝටි 5·76 ක් බවට පත්විය. ගැනීමට බලයත් සීමාවෙන් රුපියල් කෝටි 1·0 ක මුදලක් ගනු නොලැබීය.

### මහ බැංකු සුරැකුම් පත් නිකුතුව.

මුදල් නීති පනතේ (422 වැනි ජේදය) 91 (1) (ආ) වගන්තියේ විධිවිධාන යටතේ 1964 පෙබරවාරි 1 වැනි දින රුපියල් කෝටි 5·34 ක සියයට 4½ මහ බැංකු සුරැකුම්පත් (1985–89) නිකුත් කරන ලදී.

### 1964/65 අය වැය ලේඛනය.

1964/65 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ආදායම් හා වියදම් ඇස්තමේන්තු (මුල්) පහත දැක්වේ,

සංඛ්‍යා සටහන II (උ) 16

**මුල් අයවැය ඇස්තමේන්තු.**

රුපියල් දශ ලක්ෂ

| | | | |
|---|---|---|---|
| (අ) ආවර්තන වියදම් (වැය සම්මත 1, 2, 4 හා 6) | .. | 1879·4 | |
| සියයට 2½ ක ඌන වියදම් අඩුකොට | .. | 47·0 | 1832·4 |
| (ආ) ප්‍රාග්ධන වියදම් (වැය සම්මත 3, 5 හා 7) | .. | | 558·0 |
| (ඇ) මුළු වියදම [ (අ) + (ආ) ] | .. | | 2390·4 |
| (ඈ) ආදායම (නව බදු ලැබීම් ඇතුළත්ව) | .. | | 1881·4 |
| (ඉ) අය වැය හිඟය [ (ඇ) – (ඈ) ] | .. | | 509·0 |
| (ඊ) නිදන් අරමුදල් සඳහා දායක දීමනා හා රාජ්‍ය ණය ආපසු ගෙවීම් හැර | .. | | 68·3 |
| (උ) ඇස්තමේන්තු කළ ශුද්ධ අයවැය හිඟය | .. | | 440·7 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

රුපියල් කෝටි 50·9 ක්වූ අයවැය හිඟය පියැවෙනුයේ මෙසේය:-

| | | | |
|---|---|---|---|
| (අ ) | වෙළෙඳපොළෙන් ගත් ණය | – | රුපි. කෝටි 25·0 |
| (ආ) | විදේශීය ආධාර | – | රුපි. කෝටි 22·5; හා |
| (ඇ) | පරිපාලන ණය | – | රුපි. කෝටි 3·5, |

මෙයින් අයවැය හිඟය මුළුමනින්ම පියැවේ; උද්ධමනාත්මක මාර්ගවලින් ණය ගැනීමක් නොමැත.

**ආදායම.**

1964/65 වසර සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු ආදායම රුපියල් කෝටි 188·14 ක් විය. මෙයට, 1963/64 නියම (තාවකාලික) ආදායම වන රුපියල් කෝටි 175·35 හා සසඳන විට, අලුත් අයවැය යෝජනාවලින් ලැබෙන රුපියල් කෝටි 10·66 ක ශුද්ධ ලැබීමක් දඅ ඇතුළත් වෙයි. මේ බදු වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු ඉකුත් බදු වර්ෂයේ නියම (තාවකාලික) ආයමට වඩා රුපියල් කෝටි 12·79 කින් වැඩිය.

පහත දක්වෙනුයේ, අයවැය ලේඛනයෙන් යෝජිත නව ආදායම් විධිවිධානයන් හා ඒවා මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තුවන අතිරේක ආදායමය.

| | | රුපියල් දශලක්ෂ |
|---|---|---|
| (1) | ආදායම් බද්ද (සංවර්ධන ප්‍රතිදානයන් අඩුකිරිම) | 1·6 |
| (2) | වස්තු බද්ද | 11·5 |
| (3) | ඛනිජතෙල් නිෂ්පාදන සඳහා ආනයන බදු | 15·0 |
| (4) | මැණික් ගල් සඳහා අපනයන බදු | 0·2 |
| (5) | තේ බද්ද | 12·0 |
| (6) | සිගරැට් දුම්කොළ සඳහා බද්ද | 1·6 |
| (7) | මැණික් සංයුක්ත මණ්ඩලය | 10·0 |
| (8) | මුද්දර කාර්යාංශය | 1·0 |
| (9) | අනෙකුත් මාර්ගවලින් ආදායම (සවිස්තරව නැත.) | 60·1 |
| | එකතුව ( 1 සිට 9 ) | 113·0 |

එසේවුවද, යෝජනා දෙකක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීමෙන් පසු රජයට රුපියල් කෝටි 0·64 ක පාඩුවක් ඇතිවෙතැයි අපේක්ෂා කරන නිසා රජයට ලැබෙන ශුද්ධ ආදායම රුපියල් කෝටි 10·66 කැයි බලාපොරොත්තු වෙයි. ඉන් ඇතිවන පාඩුව පහත දක්වේ.

| | | රුපියල් දශලක්ෂ |
|---|---|---|
| (1) | පහළ ආදායම් පංතිවලට ආදායම් බදු සහන | 3·5 |
| (2) | ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් | 2·9 |
| | එකතුව ( 1 හා 2 ) | 6·4 |

**නව බදු විධිවිධාන.**

**(1) ආදායම් බද්ද.**

තක්සේරු කළ මුළු ආදායම වර්ෂයකට රුපියල් 15,(00 ට නොවැඩි නම් තනි පුද්ගලයකුට රුපියල් 4,000 දක්වාද, දරුවන් සතර දෙනෙකු සහිත විවාහක යුවලකට රුපියල් 13,000 දක්වාද, වූ බදු ශ්‍රෙණියට අයකරන සියයට 15 බදු අනුපාතිකය වෙනස් කොට, බදු ශ්‍රෙණියේ මුල් රුපි. 1,000 සියයට 5 බැගින්ද

එම ශ්‍රෙණියේම ඉතිරි කොටසට සියයට 15 බැගින්ද බදු අයකරනු ලැබේ. මෙම යෝජනාව අනුව, එම පහසුකම් ලැබෙන සැම බදු ගෙවන්නෙකුටම ඔහුගේ ආදායම් ප්‍රමාණය හෝ ඔහුගේ පවුලේ තත්වය ගැන හෝ නොසලකා රුපියල් 100 ක බදු සහනයක් ලැබේ. මෙකී යෝජනාව 1964/65 තක්සේරු වර්ෂය තුලදීම ක්‍රියාත්මක කරනු ඇත

බදු පැහැර හැරීම.

වැඩි වටිනාකම් ඇති මුදල් නෝට්ටු, රත්රන්, මැණික් සහ ස්වර්ණාභරණ වශයෙන් වසතුව සඟවා තැබීමෙන් බදු පැහැර හැරීමට විරුද්ධව, ගතයුතු ක්‍රියා මාර්ග, සිය අය වැය කතාවේ දී මුදල් ඇමතිතුමා විසින් යෝජනා කරන ලදී. වත්කම් සඟවාගෙන සිටින සියලු දෙනාටම එසේ සඟවා ගෙන ඇති වත්කම් හෙළිකොට එම වත්කම්වල වටිනාකමෙන් සියයට 33⅓ ක බද්දක් ගෙවා අනතුරුව නිදහසේ භුක්ති විඳීමට නිදහසක් දෙන ලදී. මේ අනුව වත්කම් ප්‍රකාශ කිරීම සඳහා 1964 දෙසැම්බර් 31 වැනිදා තෙක් කාලය දෙන ලදී. මේ සහනයෙන් ප්‍රයෝජන නොගෙන ධනය සඟවා ගෙන ඇති සියලු දෙනාම බදු දැලට අසු කර ගැනීමට 1965 ජනවාරි 1 වැනිදා සිට තදින් ක්‍රියා කරනු ලැබේ.

සංවර්ධන ප්‍රතිදාන.

පිළිගත් යෝජනා ක්‍රම හා කෘෂිකාර්මික ව්‍යාපාර වලට දී තිබුන සියයට 40 විශේෂ සංවර්ධන ප්‍රතිදානය ඉවත් කර, ඒ වෙනුවට සියලුම කාර්මික හා කෘෂිකාර්මික ව්‍යාපාරවලට සියයට 20 ක ප්‍රතිදානයක් ඒකාකාරව දීමට යෝජිතව ඇත. එසේම, කාර්මික ව්‍යාපාර සඳහා දෙනු ලබන බදු නිවාඩුව, මින් මතුවට ලැබෙන්නේ ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන ඇමතිවරයා විසින් මුදල් ඇමතිවරයා සමග එකඟත්වයකට පැමිණීමෙන් පසු, අනුමත කැරුන කර්මාන්ත සඳහා පමණකි. තවද, ලාභාංශ සඳහා වූ බදු සහනය ගෙවන ලද ප්‍රාග්ධනයෙන් සියයට 10 කට සීමා කිරීමටද යෝජනාකර ඇත යම් සමාගමක් සියයට 10 කට වැඩි ලාභාංශ බෙදා හරි නම්, දැනට පවත්නා විධිවිධාන යටතේ ලාභ හා ලාභාංශ සඳහා එයට හිමිකම් ඇති බදු සහනය අහිමි වන්නේය.

(2) වස්තු බද්ද.

වස්තු බද්ද සම්බන්ධයෙන් වැදගත් වෙනස් කිරීම් තුනක් යෝජනාකොට ඇත. ඉන් පළමුවැන්න, පුණ්‍යායතන සම්බන්ධයෙන් නියම කර ඇති වස්තු බද්දෙන් නිදහස් වීමේ සීමාව රුපියල් 20,000 ක් වන වර්තමාන මට්ටමේ සිට රුපියල් 1,00,000 දක්වා වැඩි කිරීමට යෝජනා කර ඇත. මෙය බලපවත්නේ වස්තු බද්ද පැනවූ අවුරුද්ද වන 1959/60 වර්ෂයේ සිටය. මෙම යෝජනාව හේතුකොටගෙන අවුරුද්දකට රුපියල් 50,000 ක පමණ ආදායම් හානියක් සිදුවේ යැයි ඇස්තමේන්තු කොට ඇත. දෙවැන්න, වර්තමාන බදු අනුපාතික ආකෘතියේ සංශෝධනයක් ඇති කිරීම සම්බන්ධවය. වස්තුවෙන් මුල් රුපියල් 1,00,000 බද්දෙන් නිදහස් කර එයින් සිදුවන ආදායම් හානිය වෙනස් ක්‍රමයකින් ලබාගනු වස් බදු අනුපාතිකය සංශෝධනය කිරීමට යෝජනා කර ඇත. රුපියල් 30,00,000 කට වැඩි ධනයක් ඇති අයගෙන් අය කැරෙන වැඩිම බදු අනුපාතිකය සියයට 5 දක්වා වැඩිකරනු ඇත. මෙසේ බදු අනුපාතික වැඩි කිරීමෙන් ලැබෙන වැඩි ආදායම රුපියල් කෝටි 0·45 ක් පමණ වෙයි. තෙවැනි වෙනස් කිරීම වූයේ රත් පවුම් සමාගම් කොටස්වලටද වස්තු බද්ද ව්‍යාප්ත කිරීමය. මෙම ව්‍යාපාර කොටස් ලංකාවේ පිහිටි දේපල නොවන අතර එම කොටස් ලාංකික කොටස් කරුවන්ට හැර සෙස්සනට හිමිවන විටදී, කොටස්

වල මුළු වටිනාකම වස්තු බද්දෙන් නිදහස්වේ. මෙම විෂමතාවයට පිළියමක් වශයෙන් ලංකාවේ පිහිටා ඇති නිශ්චල දේපළ අයිති ලාංකික නොවන සමාගම් වලින් වස්තු බද්ද වෙනුවට ඔවුන්ගේ ආදායමෙන් සියයට 10 ක බද්දක් අය කිරීමට යෝජනා කර ඇත. යම්කිසි පුද්ගලයකු විසින් ගෙවනු ලබන වස්තු බද්දට ලාංකික නොවන සමාගමක කොටස් වටිනාකම වෙනුවෙන් ගෙවන මුදලක්ද අඩංගුවේ නම් දෙවරක් බදු ගෙවන්නට සිදුවීම හැකිතාක් දුරට වලකනු සඳහා, සමාගම්වලින් වස්තු බද්ද වෙනුවට අය කැරෙන බද්ද ගැන සලකා බලා නිසි සහනයක් සලසනු ඇත.

**ගෙවිය හැකි බදු ප්‍රමාණය පිළිබඳ සීමාව.**

දැනට පවත්නා නීති අනුව, ඕනෑම බදු ගෙවන්නකුගෙන් ආදායම් හා වස්තු බදු වශයෙන් අයකර ගතහැකි මුළු බදු ප්‍රමාණය ඔහු සතු බදු අය කළ හැකි ආදායමෙන් සියයට 80 නොඉක්මවිය යුතුය. මෙම සීමාව ඉවත් කිරීමට යෝජනා කර ඇත.

**නිවාස දේපළ බද්ද.**

නිවාස දේපළ පිළිබඳව විශේෂ බද්දක් යෝජනා කර ඇත. යෝජිත ක්‍රමය අනුව සෑම බදු ගෙවන්නකුටම තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වටිනාකමෙහි සීමාවක් නොතකා, එක් ගෙයක් තබා ගැනීමට හැකිවන අතර එකී අයිතිය බද්දෙන් නිදහස් වෙයි. මෙයට අතිරේකව රුපියල් 1, 00, 000 වටිනා නිවාස දේපළ අයිතියකට ඉඩ ඇත. මෙම සීමාවට වැඩියෙන් ඇති සියලුම නිවාස දේපළ සඳහා ඒවායේ වටිනාකමින් සියයට 10 ක බද්දක් අය කැරෙනු ඇත. මෙම ක්‍රමය 1965 අප්‍රියෙල් 1 වැනිදා සිට ක්‍රියාත්මක කරනු ඇත.

**(3) නිරූ බදු.**

**ආනයන බද්ද.**

ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා ආනයන බදු වැඩි කිරීමට යෝජනා කර ඇත. මේ ආනයන බදු වැඩිකිරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායමෙන් හිලව් කර ගන්නා බැවින් පාරිභෝගිකයා කෙරෙහි නොපැවරෙනු ඇත. ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා බදු වැඩිකර ඇත්තේ පහත දැක්වෙන පරිදිය:-

පැට්‍රෝල් (සුපිරි) ගැලුමකට සත 12 යි.
පැට්‍රෝල් (සාමාන්‍ය) ගැලුමකට සත 10 යි.
භූමිතෙල් ගැලුමකට සත 10 යි.
මෝටර් රථ ඩීසල් තෙල් ගැලුමකට සත 07 යි.
කළු ඩීසල් තෙල් ගැළුමකට සත 07 යි.
කර්මාන්ත උදුන් තෙල් ගැලුමකට 01 යි.
ලිහිස්සිතෙල් ගැලුමකට සත 20.

"මෙම ආනයන බදු වැඩි කිරීමේ ප්‍රධාන පරමාර්ථය වූයේ, දැනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට තෙල් සපයන්නන්ගෙන් ලැබෙන වට්ටම් රජයේ ආදායමට හරවා ගැනීම" බැව් සඳහන් කැරිණි.

**අපනයන බද්ද.**

අපනයන කැරෙන මැණික් ගල් සඳහා ඒවායේ වටිනාකමෙන් සියයට 5 ක බද්දක් පනවා ඇත.

**තේ බද්ද.**

තේ රාත්තලක මිල රුපියල් 1·85 කට වැඩි වන විට, එම වැඩි වන ප්‍රමාණයෙන් සියයට 50 ක් වන අගය අනුව අය කැරෙන බද්ද (උපරිම ප්‍රමාණය සත 70 කි) වෙනුවට අක්කර 100 ට වැඩි සියළුම තේ වතු සඳහා අක්කර බද්දක් පැනවීමට යෝජනා කර ඇත. අක්කර බද්ද අය කැරෙන්නේ විශේෂ පදනමක් අනුවය. උස් බිම් තේ වගාව සඳහා අක්කරයකට රුපියල් 300 ක සහ මැදි බිම් තේ වගාව හා පහත් බිම් තේ වගාව සඳහා අක්කරයකට රුපියල් 60 ක අක්කර බද්දක් අය කිරීමට යෝජනා කර ඇත. කොළඹ වෙන්දේසිය මගින් විකුණන ලැබූ තේ සඳහා දැනට අය කැරෙන, රාත්තලකට සත 35 ක් වූ විශේෂ අපනයන බද්ද නොකඩවාම අය කැරෙනු ඇත. කොළඹ වෙන්දේසියේ නොවිකුණා ලන්ඩන් වෙන්දේසියේ විකිණීම සඳහා පටවනු ලබන තේ සඳහා රාත්තලකට සත 10 ක අතිරේක බද්දක් අය කරනු ඇත. අක්කර බද්ද මාසිකව හෝ ත්‍රෛමාසිකව ගෙවිය හැකි අතර, එම මුදල් වතු වලින් අය කරනු ඇත. අළුත් තේ බදු ක්‍රමයෙන් උසස් වර්ගයේ තේ නිෂ්පාදනයට රුකුලක් ලැබේය යන්න ඇමතිවරයාගේ බලාපොරොත්තුවයි.

**කළුතෙල් පාවිච්චි කරන මෝටර් රථ වාහන කෙරෙහි පනවෙන බද්ද.**

1965 ජනවාරි මස 1 වැනිදා සිට කළුතෙල් යොදන මෝටර් රථ වාහන බද්ද ඉවත් කිරීමට මුදල් ඇමතිවරයා යෝජනා කර ඇත. මෙම ක්‍රියා මාර්ගය හේතුකොටගෙන බදු ආදායම් හානියක් සිදු නොවන්නේ, මෝටර් රථ ඩීසල් තෙල් සඳහා වූ ආනයන බද්ද වැඩි කිරීමෙන් පෙර කී නැතිව යන ආදායම ලබා ගැනීමට අදහස් කැරෙන හෙයිනි.

**(4) අනෙකුත් ආදායම් මාර්ග.**

අයවැය ලේඛනයෙන් යෝජනා කැරුනු ආදායම් ලබා ගැනීමේ පියවරවල් ගණනාවක් මෙ ශීර්ෂය යටතේ: දක්විය. හැකිය.

1. ප්‍රචාරණ වලින් පුවත් පත් වලට ලැබෙන ආදායමෙන් බදු අය කිරීම:- පුවත් පත් වල ප්‍රචාරණ වලින් සියයට 20 ඉක්මවන පෞද්ගලික ප්‍රචාරණ සඳහා ලැබෙන ආදායමින් සියයට $32\frac{1}{2}$ ක බද්දක් අය කිරීමට යෝජනා කර ඇත. සියයට 20 සීමාව ගණන් බැලීමේදී මංගල හා අවමංගල්‍ය දැන්වීම් වැනි ගෘහස්ත හා සමාජයීය ප්‍රකාශන වලට සම්බන්ධිත ප්‍රචාරණ ඇතුලත් නොකැරේ.

2. සිගරට් දුම්කොළ:- සිගරට් දුම්කොළ සඳහා අය කැරෙන බද්ද රාත්තලකට සත 50 කින් වැඩි කිරීමට යෝජනා කර ඇත. මෙම බද්ද නිසා පාරිභෝගිකයාට සිගරට් සඳහා අධික මිලක් ගෙවන්නට හෝ නිෂ්පාදකයාට තම දුම්කොළ සඳහා අඩු මිලක් ලබන්නට හෝ සිදු නොවේ යැයි අපේක්ෂා කැරෙයි.

3. ගිනි පෙට්ටි:-ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන ඇමතිවරයා විසින් නියම කරන ලද නිෂ්පාදන ඉලක්කය සපුරා ලන නිෂ්පාදකයනට ප්‍රතිදානයක් වශයෙන් ගිනි පෙට්ටි සඳහා දැනට අය කැරෙන බද්ද සත භාගයකින් අඩු කිරීමට තීරණය කර ඇත. මෙයින් ආදායමට එතරම් හානියක් සිදු වේතැයි බලාපොරොත්තු නොවේ,

4. ගමන් වියදම් පිළිබඳ බදු පිළිවෙත:- ධන නිෂ්පාදන කටයුතු සඳහා දිවයින තුළ කෙරෙන සියලුම ගමන් වියදම් සඳහා ඉඩ ලැබෙන පරිදි, ගමන් වියදම් පිළිබඳ දැනට අනුගමනය කරනු ලබන බදු පිළිවෙත සංශෝධනය කරනු ඇත. ගමන් බිමන් සඳහා පාවිච්චි කැරෙන සියළුම වාහන සඳහා ක්ෂය ප්‍රමාණයකට ඉඩ නොලැබෙනු ඇත. සේවකයනට දෙනු ලබන ගමන් දීමනා බද්දෙන් නිදහස් මුදල් ලෙස සැලකීමට ස්වාමි පක්ෂයට දී ඇති අවසරය එසේම පවතින නමුදු අවුරුද්දකට රුපියල් 1200 ඉක්මවන සියළුම ගමන් දීමනාවන් ආදායම් ලෙස සලකනු ලැබේ.

5. මුද්දර කාර්යාංශයක් පිහිටුවීම හා විශේෂ මුද්දර නිකුත් කිරීම:-1965 ජනවාරි මාසයේ පටන් ක්‍රියාත්මක වන පරිදි මුද්දර රැස්කිරීමේ කටයුතු පිළිබඳ කාර්යාංශයක් පිහිටුවීමට යෝජනා කර ඇත.

6. රජයේ මැණික් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවීම:- දිවයිනේ ඇති මැණික් පතල් වලින් බලපත්‍ර ගාස්තු අය කර ගැනීම හා මැණික් කර්මාන්තයට සම්බන්ධිත ව්‍යාපාරිකයන්, තැරව්කාරයන්, වෙන්දේසිකරුවන්, වෙළෙන්දන් හා මැණික් කපන්නන් කෙරෙහි බදු පැනවීමේ බලය මැණික් සංයුක්ත මණ්ඩලයට ලැබෙනු ඇත. මෙම පියවර මගින් සැලකිය යුතු විදේශීය විනිමය ප්‍රමාණයක් උපයා ගැනීම හැර රුපියල් කෝටි 1·0 ක අතිරේක ආදායමක් ද බලාපොරොත්තුවනු ලැබේ.

**වර්තන වියදම.**

මුළු ආවර්තන වියදම (වැය සම්මත 1, 2, 4, හා 6) රුපියල් කෝටි 187·94 ක් විය. මෙම සංඛ්‍යාවෙන්, ආවර්තන වියදම යටතේ වූ ප්‍රාග්ධන ස්වභාවීය ශීර්ෂ හා නිදන් අරමුදල් දායක දීමනා සඳහා ප්‍රතිපාදන හා අවක්‍රමණය බේරීම අඩුකළ පසු ඉතිරි වර්තන වියදම රුපියල් කෝටි 174·51 ක් වෙයි. මෙය 1963/64 රුපියල් කෝටි 175·84 ක් වූ නියම (තාවකාලික) වියදමට සම කළ හැකිය. 1964/65 වර්තන වියදම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර සහනාධාර වියදම සඳහා ප්‍රතිදාන අඩුවීමත් මහ බැංකුව මිලට ගත් භාණ්ඩාගාර බිල් සඳහා ගෙවන පොලී අනුපාතිකය අඩුවීමත්ය.

**ප්‍රාග්ධන වියදම.**

ප්‍රාග්ධන වියදම් පිළිබඳ මුල් ඇස්තමේන්තු (වැය සම්මත 3, 5, හා 7) රුපි. කෝටි 55·8 කි. මෙයට ආවර්තන වියදම් වැය සම්මත යටතේ වූ ප්‍රාග්ධන ශීර්ෂ හා සංචිත වලින් වූ අධි අයවැය ලේඛනමය ප්‍රාග්ධන වියදම් එකතු කළ විට 1964/65 බදු වර්ෂයේ මුළු ප්‍රාග්ධන වියදම රුපි. කෝටි 64·76 ක් වෙයි. මෙය 1963/64 නියම (තාවකාලික) වියදමට වඩා රුපි. කෝටි 14·43 කින්ද 1963/64 මුල් ඇස්තමේන්තුවට වඩා රුපියල් කෝටි 0·82 කින්ද වැඩිය.

**අයවැය හිඟය පියවීම.**

අවසාන වරට පාර්ලිමේන්තුවෙන් සම්මත වූ රජයේ ගිණුම්වලින් පිළිබිඹු වන පරිදි රුපි. කෝටි 50·9 ක අයවැය හිඟයක් දක්වේ. මෙම හිඟය පියවීම සඳහා රුපි. කෝටි 25·0 ක් රුපියල් ණය වලින්ද, රුපි. කෝටි 22·5 ක් විදේශීය ආධාරවලින්ද, රුපියල් කෝටි 3·5 ක් පරිපාලන ණය වලින්ද ලබාගැනීමට බලාපොරොත්තු වෙයි. රුපි. කෝටි 51·0 වන මෙහි එකතුවෙන් යෝජිත හිඟය සම්පූර්ණයෙන්ම පියැවෙනු ඇත.

**සංක්ෂේපය:-**

1964 දෙසැම්බර් මාසයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරිය බැවින්, අය වැය කතාවෙන් යෝජනා කරන ලද ආදායම් ලබා ගැනීමේ අලුත් පියවරවල් කිහිපයක් තවමත් පනවා නැත. මේවාට, සියයට 20 ක පොදු සංවර්ධන ප්‍රතිදානයක් ආරම්භ කිරීම, අය කළ හැකි බදු ප්‍රමාණය පිළිබඳ සියයට 80 සීමාව ඉවත් කිරීම, නිවාස දේපළ බද්ද, තේ බද්ද, පුවත් පත් ප්‍රචාරණ ආදායමින් අය කැරෙන බද්ද හා රජයේ මැණික් සංයුක්ත මණ්ඩලයක් සහ මුද්දර කාර්යාංශයක් පිහිටුවීම ඇතුළත් වෙයි.

ලැබෙන විදේශාධාර වෙන වෙනම ගෙන සවිස්තරව විග්‍රහකොට මීළඟ කොටසේ දක්වේ.

**විදේශාධාර.**

රුපියල් කෝටි 22·5 ක විදේශාධාරයක් ලැබෙතැයි 1964/65 අයවැය ලේඛනයෙන් බලාපොරොත්තු විය. මෙය පසුගිය මුදල් වර්ෂයේ බලාපොරොත්තුවූ ප්‍රමාණයට වඩා රුපි. කෝටි 5·0 කින් වැඩිය. 1963/64 ලැබුන විදේශිය ආධාර හා සසඳන විට 1964/65 බලාපොරොත්තු වන විදේශාධාර රුපි. කෝටි 11·75 කින් වැඩිය. මෙයින් රුපි. කෝටි 12·86 ක් නියමිත යෝජනා ක්‍රම සඳහා වෙන් කැරිණි. මෙම මුදලින් රුපි. කෝටි 7·83 ක් ණය මාලාවන් යටතේ ලැබෙන ණයවලින්ද, රුපි. කෝටි 5·03 ක් දීමනා වශයෙන්ද ලැබේ.

විදේශීය ණය හා ණය ක්‍රම මගින් ලැබෙන මුදල් වලින්, කැනඩාවෙන් ලැබෙන රුපියල් කෝටි 2·08 ක ණය මස්කෙළි ඔය සංවර්ධන ක්‍රමය සඳහා ද බටහිර ජර්මනියෙන් ලැබෙන රුපියල් කෝටි 1·42 ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ ප්‍රාග්ධන වශයෙන් ද, ජා. ප්‍ර. ස. බැංකුවෙන් ලැබෙන රුපි. කෝටි 1·12 ජල විදුලි ක්‍රමයේ 11 ආ අවස්ථාව සඳහාද සෝ. ස. ස. සං. ලැබෙන රුපි. කෝටි 8·3 ලංකා වානේ සංස්ථාවේ ප්‍රාග්ධනයට දයක දීමනා වශයෙන් ද වෙන් කෙරේ. මෙම මුදල් වර්ෂය තුළදී ලැබෙතැයි බලාපොරොත්තු වන විදේශිය දීමනා වලින් කටුනායක ගුවන් තොටුපළ සංවර්ධනය කිරීම සඳහා කැනඩාවෙන් ලැබෙන රුපියල් කෝටි 1·45 හා චීන මහජන සමූහාණ්ඩුවෙන් ආර්ථික ආධාර යටතේ ලැබෙන රුපියල් කෝටි 1·29 ක් වූ මගීන් හා බඩු ගෙනයන දුම්රිය පෙට්ටි තොගයේ දෙවැනි කොටස, ප්‍රධාන වෙයි.

---

සංලක්ෂය;—1964/65 මුල් අයවැය ඇස්තමේන්තුවලට භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරන ලද තාවකාලික සංශෝධනයක් අනුව, අයවැය කතාවෙන් යෝජිත, ආදයම් ලබාගැනීමේ යෝජනා සමහරක් ක්‍රියාත්මක නොකර තිබියදීත් මුළු ආදයම් එකතුව මුල් අයවැය ඇස්තමේන්තු ඉක්මවා යන්නේ යයි බලාපොරොත්තු වෙයි. බලාපොරොත්තුවන වැඩි ආදයම් එකතුව සමන්විත වනුයේ කළුතෙල් පාවිච්චි කරන මෝටර් රථ බදුවල හිඟ මුදල් වශයෙන් ලංකා ගමනා ගමන මණ්ඩලයේ දයක දීමනා වැඩිවීම, ආදයම් බද්ද, දුම්කොළ බද්ද හා රබර් අපනයන බදු එකතුව අඩුවීමෙන් සමහන් වී ගිය පොල් නිෂ්පාදිත වලින් අයකැරුන අපනයන බදු යන මේ ශීර්ෂ වලිනි. මුළු ආදයමෙහි වැඩිවීමක් බලාපොරොත්තු වන අතර, මුළු වියදම අයවැය ලේඛනයෙන් බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා පහළ වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙයට විශාල වශයෙන්ම හේතුවූයේ ආහාර පිහිටාධාර බිලෙහි සැලකිය යුතු අඩුවීමක් ඇතිවීමට ඉඩකඩ තිබීමය. මෙයින් සුළි සුළං සහනාධාර හා මහා මැතිවරණයක් පැවැත්වීම යනාදිය සඳහා වූ වියදම්ද ඇතුළු අතිරේක වැය ශීර්ෂ සඳහා වූ වියදම් වැඩිවීම පමනටත් වඩා මැකීයයි. මෙකී හේතූන් අනුව සලකා බලන කල, බලාපොරොත්තු වන වියදම් පහළ වැටීමත් සමගම අපේක්ෂිත ආදයම් වැඩිවීම හේතු කොට ගෙන පොදු අය වැය හිඟය සැලකිය යුතු තරමකින් අඩුවිය යුතුය.